## අ.පො.ස (සා.පෙළ) විභාගය - 2018

# ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018

## ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරෙන් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට ද මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස් කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරු භවතුන්ට, ගුරු උපදේශකවරුන්ට, විදුහල්පතිවරුන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එකසේ ප්‍රයෝජනවත් වනු නො අනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අපේක්ෂකයන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන් ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කර ගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයෙහි I, II හා III ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැ යි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායි අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයන්ටත් RD ආකෘති මගින් තොරතුරු සැපයූ ප්‍රධාන/අතිරේක ප්‍රධාන/සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2019 දෙසැම්බර් 30
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශනය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එස්. ප්‍රනවදාසන්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - පාසල් විභාග) |
| **විෂය සම්බන්ධීකරණය** | : | පී.ඩී.එන්. මැණිකේ<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>ශ්‍රියානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **සැකසුම් කමිටුව** | : | ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>එච්.ජී. සුසිල් සිරිසේන මයා<br>කථිකාචාර්ය<br>හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම.<br><br>ආර්.කේ.ඒ.එල්. පද්මසිරි<br>ගුරු උපදේශක (ශ්‍රී ලං. ගු. සේ.1)<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය,<br>කුලි/නැගෙනහිර, නක්කාවත්ත.<br><br>එච්.එම්.එස්. බණ්ඩාර<br>ගුරු උපදේශක, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, මහව.<br><br>අයි.ඩී. සිරිමෙවන් මල්ලිකා (ශ්‍රී ලං.ගු.සේ. 1)<br>අ/තලාව මහා විද්‍යාලය, තලාව.<br><br>ආර්.ජී. විජේසිංහ<br>ර/බටුහේන මහා විද්‍යාලය, හිදැල්ලන.<br><br>බී.ඒ.කේ.එස්. බාලසූරිය (ශ්‍රී ලං.ගු.සේ. 1)<br>ගම්/අනුර මධ්‍ය මහා විද්‍යාලය, යක්කල. |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ. ඒ. අයි. බණ්ඩාර<br>තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර II |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10
1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 11
1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 11
1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 12


## II කොටස


2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 13
2.1.2 I ප්‍රශ්න පත්‍රය 14
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව) 19
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ගෙන ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 20
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 24
2.2.2 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 25

2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 44
2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුර, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 45


## III කොටස


3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 65
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා 66

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

* අවබෝධයෙන් යුතු ව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
* නිරවුල් ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ජීවිත පරිඥානය ලබා දීම
* ජීවන වෘත්තීන්ට අදාළ ව භාෂාව ප්‍රායෝගික ව උපයෝගි කර ගැනීමේ කුසලතා වර්ධනය කිරීම
* සිංහල භාෂා සාහිත්‍ය පරිචය මගින් සංස්කෘතික දායාද, ආචාර ධර්ම හා ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයුම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමෙන් ලබා ගත් අද්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 241570 | 8671 | 250241 |

වගුව 1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 46507 | 19.25 | 528 | 6.09 | 47035 | 18.80 |
| B | 50123 | 20.75 | 936 | 10.79 | 51059 | 20.40 |
| C | 85088 | 35.22 | 3123 | 36.02 | 88211 | 35.25 |
| S | 38504 | 15.94 | 2263 | 26.10 | 40767 | 16.29 |
| W | 21348 | 8.84 | 1821 | 21.00 | 23169 | 9.26 |
| එකතුව | **241570** | **100.00** | **8671** | **100.00** | **250241** | **100.00** |

වගුව 2

### 1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 29548 | 8175 | 27.67 | 6645 | 22.49 | 8908 | 30.15 | 3469 | 11.74 | 27197 | 92.04 | 2351 | 7.96 |
| 2. ගම්පහ | 27195 | 5487 | 20.18 | 5946 | 21.86 | 9083 | 33.40 | 3990 | 14.67 | 24506 | 90.11 | 2689 | 9.89 |
| 3. කළුතර | 15171 | 3387 | 22.33 | 3256 | 21.46 | 4944 | 32.59 | 2215 | 14.60 | 13802 | 90.98 | 1369 | 9.02 |
| 4. මහනුවර | 16659 | 3213 | 19.29 | 3545 | 21.28 | 6124 | 36.76 | 2430 | 14.59 | 15312 | 91.91 | 1347 | 8.09 |
| 5. මාතලේ | 5885 | 834 | 14.17 | 1136 | 19.30 | 2230 | 37.89 | 1046 | 17.77 | 5246 | 89.14 | 639 | 10.86 |
| 6. නුවරඑළිය | 4873 | 561 | 11.51 | 960 | 19.70 | 1973 | 40.49 | 891 | 18.28 | 4385 | 89.99 | 488 | 10.01 |
| 7. ගාල්ල | 15282 | 3584 | 23.45 | 3348 | 21.91 | 5145 | 33.67 | 2077 | 13.59 | 14154 | 92.62 | 1128 | 7.38 |
| 8. මාතර | 11579 | 2883 | 24.90 | 2658 | 22.96 | 3779 | 32.64 | 1525 | 13.17 | 10845 | 93.66 | 734 | 6.34 |
| 9. හම්බන්තොට | 8960 | 1693 | 18.90 | 2060 | 22.99 | 3228 | 36.03 | 1293 | 14.43 | 8274 | 92.34 | 687 | 7.66 |
| 10. යාපනය | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 12. මන්නාරම | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 13. වව්නියාව | 260 | 23 | 8.85 | 43 | 16.54 | 105 | 40.38 | 48 | 18.46 | 219 | 84.23 | 41 | 15.77 |
| 14. මුලතිව් | 88 | 6 | 6.82 | 9 | 10.23 | 30 | 34.09 | 27 | 30.68 | 72 | 81.82 | 16 | 18.18 |
| 15. මඩකලපුව | 41 | 3 | 7.32 | 4 | 9.76 | 0 | 41.46 | 10 | 24.39 | 34 | 82.93 | 7 | 17.07 |
| 16. අම්පාර | 4072 | 502 | 12.33 | 793 | 19.47 | 1628 | 39.39 | 720 | 17.68 | 3619 | 88.88 | 453 | 11.12 |
| 17. ත්‍රිකුණාමලය | 1586 | 143 | 9.02 | 250 | 15.76 | 623 | 39.28 | 327 | 20.62 | 1343 | 84.68 | 243 | 15.32 |
| 18. කුරුණෑගල | 21813 | 4628 | 21.22 | 5015 | 22.99 | 7792 | 35.72 | 2927 | 13.42 | 20362 | 93.35 | 1451 | 6.65 |
| 19. පුත්තලම | 8427 | 1255 | 14.89 | 1740 | 20.65 | 3133 | 37.18 | 1438 | 17.06 | 7566 | 89.78 | 861 | 10.22 |
| 20. අනුරාධපුරය | 12517 | 2113 | 16.88 | 2590 | 20.69 | 4467 | 35.69 | 2079 | 16.61 | 11249 | 89.87 | 1268 | 10.13 |
| 21. පොළොන්නරුව | 5403 | 906 | 16.77 | 1036 | 19.17 | 1927 | 35.79 | 898 | 16.62 | 4774 | 88.36 | 629 | 11.64 |
| 22. බදුල්ල | 9882 | 1667 | 16.87 | 2168 | 21.94 | 3793 | 38.38 | 1441 | 14.58 | 9069 | 91.77 | 813 | 8.23 |
| 23. මොනරාගල | 6693 | 786 | 11.74 | 1173 | 17.53 | 2588 | 38.73 | 1214 | 18.14 | 5765 | 86.13 | 928 | 13.87 |
| 24. රත්නපුරය | 13842 | 2638 | 19.06 | 3147 | 22.74 | 5009 | 36.19 | 1948 | 14.07 | 12742 | 92.05 | 1100 | 7.95 |
| 25. කෑගල්ල | 10239 | 2000 | 19.53 | 2406 | 23.50 | 3704 | 36.18 | 1355 | 13.23 | 9465 | 92.44 | 774 | 7.56 |
| **සමස්ත දිවයින** | **230015** | **46487** | **20.21** | **49928** | **21.71** | **80217** | **34.87** | **33368** | **14.51** | **210000** | **91.30** | **20015** | **8.70** |

වගුව 3

1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් විභාග අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 11674 | 4000 | 34.26 | 2391 | 20.48 | 3157 | 27.04 | 1220 | 10.45 | 10768 | 92.24 | 906 | 7.76 |
| 2. හෝමාගම | 4591 | 1004 | 21.87 | 1086 | 23.65 | 1526 | 33.24 | 558 | 12.15 | 4174 | 90.92 | 417 | 9.08 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 7597 | 1995 | 26.26 | 1829 | 24.08 | 2341 | 30.81 | 919 | 12.10 | 7084 | 93.25 | 513 | 6.75 |
| 4. පිළියන්දල | 5686 | 1176 | 20.68 | 1339 | 23.55 | 1884 | 33.13 | 772 | 13.58 | 5171 | 90.94 | 515 | 9.06 |
| 5. ගම්පහ | 7917 | 2288 | 28.90 | 1751 | 22.12 | 2276 | 28.75 | 943 | 11.91 | 7258 | 91.68 | 659 | 8.32 |
| 6 මිනුවන්ගොඩ | 5107 | 725 | 14.20 | 1125 | 22.03 | 1879 | 36.79 | 844 | 16.53 | 4573 | 89.54 | 534 | 10.46 |
| 7. මීගමුව | 7066 | 1199 | 16.97 | 1499 | 21.21 | 2476 | 35.04 | 1094 | 15.48 | 6268 | 88.71 | 798 | 11.29 |
| 8. කැලණිය | 7105 | 1275 | 17.95 | 1571 | 22.11 | 2452 | 34.51 | 1109 | 15.61 | 6407 | 90.18 | 698 | 9.82 |
| 9. කළුතර | 7204 | 1714 | 23.79 | 1497 | 20.78 | 2267 | 31.47 | 1040 | 14.44 | 6518 | 90.48 | 686 | 9.52 |
| 10. මතුගම | 3155 | 668 | 21.17 | 721 | 22.85 | 1082 | 34.29 | 439 | 13.91 | 2910 | 92.23 | 245 | 7.77 |
| 11. හොරණ | 4812 | 1005 | 20.89 | 1038 | 21.57 | 1595 | 33.15 | 736 | 15.30 | 4374 | 90.90 | 438 | 9.10 |
| 12. නුවර | 6557 | 2123 | 32.38 | 1558 | 23.76 | 1923 | 29.33 | 653 | 9.96 | 6257 | 95.42 | 300 | 4.58 |
| 13. දෙනුවර | 1701 | 182 | 10.70 | 349 | 20.52 | 690 | 40.56 | 304 | 17.87 | 1525 | 89.65 | 176 | 10.35 |
| 14. ගම්පොළ | 2446 | 293 | 11.98 | 421 | 17.21 | 976 | 39.90 | 468 | 19.13 | 2158 | 88.23 | 288 | 11.77 |
| 15. තෙල්දෙනිය | 1663 | 149 | 8.96 | 306 | 18.40 | 726 | 43.66 | 298 | 17.92 | 1479 | 88.94 | 184 | 11.06 |
| 16. වත්තේගම | 2009 | 239 | 11.90 | 436 | 21.70 | 814 | 40.52 | 332 | 16.53 | 1821 | 90.64 | 188 | 9.36 |
| 17. කටුගස්තොට | 2283 | 227 | 9.94 | 475 | 20.81 | 995 | 43.58 | 375 | 16.43 | 2072 | 90.76 | 211 | 9.24 |
| 18. මාතලේ | 2818 | 594 | 21.08 | 610 | 21.65 | 1018 | 36.12 | 395 | 14.02 | 2617 | 92.87 | 201 | 7.13 |
| 19. ගලේවෙල | 2051 | 137 | 6.68 | 344 | 16.77 | 802 | 39.10 | 456 | 22.23 | 1739 | 84.79 | 312 | 15.21 |
| 20. නාඋල | 482 | 41 | 8.51 | 90 | 18.67 | 199 | 41.29 | 95 | 19.71 | 425 | 88.17 | 57 | 11.83 |
| 21. විල්ගමුව | 534 | 62 | 11.61 | 92 | 17.23 | 211 | 39.51 | 100 | 18.73 | 465 | 87.08 | 69 | 12.92 |
| 22. නුවරඑළිය | 690 | 55 | 7.97 | 128 | 18.55 | 261 | 37.83 | 153 | 22.17 | 597 | 86.52 | 93 | 13.48 |
| 23. කොත්මලේ | 855 | 95 | 11.11 | 175 | 20.47 | 358 | 41.87 | 156 | 18.25 | 784 | 91.70 | 71 | 8.30 |
| 24. හැටන් | 793 | 95 | 11.98 | 160 | 20.18 | 334 | 42.12 | 140 | 17.65 | 729 | 91.93 | 64 | 8.07 |
| 25. වලපනේ | 933 | 102 | 10.93 | 170 | 18.22 | 407 | 43.62 | 162 | 17.36 | 841 | 90.14 | 92 | 9.86 |
| 26. හඟුරන්කෙත | 1602 | 214 | 13.36 | 327 | 20.41 | 613 | 38.26 | 280 | 17.48 | 1434 | 89.51 | 168 | 10.49 |
| 27. ගාල්ල | 7034 | 2064 | 29.34 | 1519 | 21.60 | 2070 | 29.43 | 884 | 12.57 | 6537 | 92.93 | 497 | 7.07 |
| 28. ඇල්පිටිය | 3132 | 444 | 14.18 | 700 | 22.35 | 1268 | 40.49 | 476 | 15.20 | 2888 | 92.21 | 244 | 7.79 |
| 29. අම්බලන්ගොඩ | 3335 | 776 | 23.27 | 717 | 21.50 | 1127 | 33.79 | 442 | 13.25 | 3062 | 91.81 | 273 | 8.19 |
| 30. උඩුගම | 1781 | 300 | 16.84 | 412 | 23.13 | 680 | 38.18 | 275 | 15.44 | 1667 | 93.60 | 114 | 6.40 |
| 31. මාතර | 5292 | 1659 | 31.35 | 1204 | 22.75 | 1438 | 27.17 | 657 | 12.41 | 4958 | 93.69 | 334 | 6.31 |
| 32. අකුරැස්ස | 1943 | 401 | 20.64 | 414 | 21.31 | 691 | 35.56 | 304 | 15.65 | 1810 | 93.15 | 133 | 6.85 |
| 33. මුලටියන-හක්මන | 2173 | 401 | 18.45 | 527 | 24.25 | 792 | 36.45 | 314 | 14.45 | 2034 | 93.60 | 139 | 6.40 |
| 34. මොරවක-දෙණියාය | 2171 | 422 | 19.44 | 513 | 23.63 | 858 | 39.52 | 250 | 11.52 | 2043 | 94.10 | 128 | 5.90 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 2544 | 467 | 18.36 | 593 | 23.31 | 896 | 35.22 | 364 | 14.31 | 2320 | 91.19 | 224 | 8.81 |
| 36. හම්බන්තොට | 3850 | 635 | 16.49 | 827 | 21.48 | 1054 | 30.21 | 682 | 19.55 | 3495 | 90.78 | 441 | 12.64 |
| 37. වලස්මුල්ල | 2566 | 591 | 23.03 | 640 | 24.94 | 698 | 28.22 | 333 | 13.47 | 2459 | 95.83 | 145 | 5.86 |
| 38. යාපනය | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 39. දූපත් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 41. වලිකාමම් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 43. කිලිනොච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 44. මන්නාරම | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 45. මඩු | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 46. වව්නියාව | 260 | 23 | 8.85 | 43 | 16.54 | 105 | 40.38 | 48 | 18.46 | 219 | 84.23 | 41 | 15.77 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 48. මුලතිව් | 88 | 6 | 6.82 | 9 | 10.23 | 30 | 34.09 | 27 | 30.68 | 72 | 81.82 | 16 | 18.18 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 50. මඩකලපුව | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 51. කල්කුඩා | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 52. පදිරිප්පු | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 53. මඩකලපුව මධ්‍යම | 41 | 3 | 7.32 | 4 | 9.76 | 17 | 41.46 | 10 | 24.39 | 34 | 82.93 | 7 | 17.07 |
| 54. මඩකලපුව බටහිර | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 55. අම්පාර | 2505 | 336 | 13.01 | 524 | 20.92 | 966 | 38.56 | 417 | 16.65 | 2233 | 89.14 | 272 | 10.86 |
| 56. කල්මුනේ | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 57. සමන්තුරෙයි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 58. මහඔය | 606 | 58 | 9.57 | 100 | 16.50 | 248 | 40.92 | 123 | 20.30 | 529 | 87.29 | 77 | 12.71 |
| 59.දෙහිඅත්තකණ්ඩිය | 961 | 118 | 12.28 | 169 | 17.59 | 390 | 40.58 | 180 | 18.73 | 857 | 89.18 | 104 | 10.82 |
| 60. තිරුක්කෝවිල් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 61. අක්කරෙයිපත්තුව | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 62. ත්‍රිකුණාමලය | 318 | 29 | 9.12 | 45 | 14.15 | 126 | 39.62 | 65 | 20.44 | 265 | 83.33 | 53 | 16.67 |
| 63. මුතූර් | 7 | 0 | 0.00 | 0 | 0.00 | 5 | 71.43 | 2 | 28.57 | 7 | 100.00 | 0 | 0.00 |
| 64. කන්තලේ | 894 | 97 | 10.85 | 139 | 15.55 | 364 | 40.72 | 177 | 19.80 | 777 | 86.91 | 117 | 13.09 |
| 65. ත්‍රිකුණාමලය (උතුර) | 367 | 17 | 4.63 | 66 | 17.98 | 128 | 34.88 | 83 | 22.62 | 942 | 80.11 | 73 | 19.89 |
| 66. කින්නියා | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 67. කුරුණෑගල | 5506 | 1577 | 28.64 | 1293 | 23.48 | 1713 | 31.11 | 611 | 11.10 | 5194 | 94.33 | 312 | 5.67 |
| 68. කුලියාපිටිය | 3826 | 983 | 25.69 | 899 | 23.50 | 1347 | 35.21 | 452 | 11.81 | 3681 | 96.21 | 145 | 3.79 |
| 69. නිකවැරටිය | 2752 | 501 | 18.20 | 717 | 26.05 | 1015 | 36.88 | 372 | 13.52 | 2605 | 94.66 | 147 | 5.34 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 70. මහව | 3625 | 575 | 15.86 | 804 | 22.18 | 1412 | 38.95 | 541 | 14.92 | 3332 | 91.92 | 293 | 8.08 |
| 71. ගිරිඋල්ල | 3295 | 556 | 16.87 | 731 | 22.19 | 1205 | 36.57 | 497 | 15.08 | 2989 | 90.71 | 306 | 9.29 |
| 72. ඉබ්බාගමුව | 2809 | 436 | 15.52 | 571 | 20.33 | 1100 | 39.16 | 454 | 16.16 | 2561 | 91.17 | 248 | 8.83 |
| 73. පුත්තලම | 3076 | 319 | 10.37 | 539 | 17.57 | 1167 | 38.26 | 597 | 19.57 | 2637 | 85.73 | 432 | 14.16 |
| 74. හලාවත | 5351 | 936 | 17.49 | 1201 | 22.39 | 1966 | 36.56 | 841 | 15.64 | 4929 | 92.11 | 429 | 7.98 |
| 75. අනුරාධපුරය | 4444 | 1128 | 25.38 | 958 | 21.56 | 1356 | 30.51 | 629 | 14.09 | 4068 | 91.54 | 376 | 8.42 |
| 76. තඹුත්තේගම | 2388 | 271 | 11.35 | 486 | 20.35 | 958 | 40.12 | 406 | 17.00 | 2121 | 88.82 | 267 | 11.18 |
| 77. කැකිරාව | 2322 | 305 | 13.14 | 478 | 20.59 | 860 | 37.04 | 438 | 18.86 | 2081 | 89.62 | 241 | 10.38 |
| 78. ගලෙන්බිඳුණුවැව | 1523 | 192 | 12.61 | 305 | 20.03 | 595 | 39.07 | 276 | 18.12 | 1368 | 89.82 | 155 | 10.18 |
| 79. කැබිතිගොල්ලෑව | 1840 | 217 | 11.79 | 363 | 19.41 | 691 | 37.99 | 330 | 18.14 | 1611 | 87.55 | 229 | 12.59 |
| 80. පොළොන්නරුව | 1556 | 321 | 20.63 | 300 | 19.28 | 529 | 34.00 | 249 | 16.00 | 1399 | 89.91 | 157 | 10.09 |
| 81. හිඟුරක්ගොඩ | 2454 | 434 | 17.69 | 468 | 19.07 | 862 | 35.13 | 402 | 16.38 | 2166 | 88.26 | 288 | 11.74 |
| 82. දිඹුලාගල | 1393 | 151 | 10.84 | 268 | 18.83 | 536 | 39.27 | 244 | 17.88 | 1209 | 86.79 | 178 | 13.04 |
| 83. බදුල්ල | 1980 | 430 | 21.72 | 477 | 24.09 | 700 | 35.35 | 242 | 12.22 | 1849 | 93.38 | 131 | 6.62 |
| 84. බණ්ඩාරවෙල | 2443 | 656 | 26.85 | 597 | 24.44 | 762 | 31.19 | 268 | 10.97 | 2283 | 93.45 | 160 | 6.55 |
| 85. මහියංගනය | 1955 | 207 | 10.59 | 312 | 15.96 | 818 | 41.84 | 357 | 18.26 | 1694 | 86.65 | 261 | 13.35 |
| 86. වැලිමඩ | 2150 | 248 | 11.53 | 496 | 23.07 | 918 | 42.70 | 358 | 16.65 | 2020 | 93.95 | 130 | 6.05 |
| 87. පස්සර | 545 | 69 | 12.66 | 122 | 22.39 | 226 | 41.47 | 79 | 14.50 | 496 | 91.01 | 49 | 8.99 |
| 88. වියලුව | 809 | 57 | 7.05 | 164 | 20.27 | 369 | 45.61 | 137 | 16.93 | 727 | 89.86 | 82 | 10.14 |
| 89. මොනරාගල | 2072 | 255 | 12.31 | 368 | 17.76 | 814 | 39.29 | 365 | 17.62 | 1802 | 86.97 | 270 | 13.03 |
| 90. වැල්ලවාය | 1768 | 169 | 9.56 | 290 | 16.43 | 698 | 39.68 | 357 | 20.30 | 1519 | 85.92 | 248 | 14.10 |
| 91. බිබිල | 1554 | 209 | 13.45 | 278 | 17.89 | 591 | 38.03 | 270 | 17.37 | 1348 | 86.74 | 206 | 13.26 |
| 92. තණමල්විල | 1299 | 153 | 11.78 | 237 | 18.24 | 485 | 37.34 | 221 | 17.01 | 1096 | 84.37 | 203 | 15.63 |
| 93. රත්නපුර | 5754 | 1477 | 25.71 | 1322 | 22.98 | 1784 | 31.05 | 716 | 12.46 | 5299 | 92.24 | 446 | 7.76 |
| 94. බලන්ගොඩ | 2367 | 322 | 13.60 | 527 | 22.35 | 990 | 41.83 | 361 | 15.25 | 2200 | 92.94 | 167 | 7.06 |
| 95. නිවිතිගල | 2145 | 282 | 13.15 | 482 | 22.47 | 876 | 40.84 | 354 | 16.50 | 1994 | 92.96 | 151 | 7.04 |
| 96. ඇඹිලිපිටිය | 3585 | 557 | 15.54 | 816 | 22.76 | 1359 | 37.91 | 517 | 14.42 | 3249 | 90.63 | 336 | 9.37 |
| 97. කෑගල්ල | 4211 | 1065 | 25.29 | 1015 | 24.07 | 1396 | 33.15 | 484 | 11.49 | 3960 | 94.04 | 251 | 5.96 |
| 98. මාවනැල්ල | 3052 | 533 | 17.46 | 731 | 23.95 | 1114 | 36.50 | 411 | 13.47 | 2789 | 91.38 | 263 | 8.62 |
| 99. දෙහිඕවිට | 2976 | 402 | 13.51 | 660 | 22.18 | 1194 | 40.12 | 460 | 15.46 | 2716 | 91.26 | 260 | 8.74 |
| **සමස්ත දිවයින** | **230015** | **46487** | **20.21** | **49928** | **21.71** | **80217** | **34.87** | **33368** | **14.51** | **210000** | **91.30** | **20015** | **8.70** |

වගුව 4

1.2.5 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 164 | 0.07 | 250241 | 100.00 |
| 81 - 90 | 13733 | 5.48 | 250077 | 99.93 |
| 71 - 80 | 43217 | 17.27 | 236344 | 94.45 |
| 61 - 70 | 51063 | 20.41 | 193127 | 77.18 |
| 51 - 60 | 46628 | 18.63 | 142064 | 56.77 |
| 41 - 50 | 38571 | 15.41 | 95436 | 38.14 |
| 31 - 40 | 29234 | 11.68 | 56865 | 22.73 |
| 21 - 30 | 17186 | 6.87 | 27631 | 11.05 |
| 11 - 20 | 7722 | 3.09 | 10445 | 4.18 |
| 01 - 10 | 2719 | 1.09 | 2723 | 1.09 |
| 00 - 00 | 4 | 0.00 | 4 | 0.00 |

වගුව 5

ඉහත වගුවට අනුව සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 250241 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් සංඛ්‍යාව 29234 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 11.68%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 56865 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 22.72%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණවලින් පෙන්වා දී ඇත.

උදා : අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 9 ප්‍රශ්නයට ය. එහි පහසුතා දර්ශකය 0.92කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 92%ක් එම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සපයා ඇති බව යි. එනම් එහි පහසුතාව 92%කි. අවම පහසුතාව 39 ප්‍රශ්නය සඳහා දක්වා ඇත. එහි පහසුතා දර්ශකය 0.08කි. එයින් පැහැදිලි වන්නේ අපේක්ෂකයන්ගෙන් 8%කට ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයිය හැකි වුව ද අපේක්ෂකයන්ගෙන් 92%කට එම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සැපයීමට නොහැකි වූ බව යි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය




මෙම ප්‍රශ්න පත්‍රයෙහි සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් මෙම ප්‍රස්තාරයට අනුව, පළමුවන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 96%ක් පිළිතුරු සපයා තිබුණු අතර අඩු ම සංඛ්‍යාවක් ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්න අංක 5 සඳහා පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයන්ගෙන් 91%ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




ප්‍රශ්න අංක 1 සඳහා වෙන් කර ඇති ලකුණු 20න් මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 15%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 16%කි.

ප්‍රස්තාරය 3 (RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.

වඩාත් කැපී පෙනෙන ලෙස ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට අපේක්ෂකයන්ට හැකි වී ඇත්තේ හතරවන ප්‍රශ්නය සඳහා යි. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10න් ලකුණු 8ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 70%කි. එනම් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් හතරෙන් තුනකටත් වැඩි ප්‍රමාණයක් ම ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබා ගෙන ඇත.




ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා - ප්‍රශ්න අංක 1 **(x)** කොටසේ පහසුතා දර්ශකය 0.89කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 89%ක් එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සපයා ඇති බව යි. එනම් එහි පහසුතාව 89%කි. ප්‍රශ්න අංක 1 (vii) කොටසේ (අ) අනුකොටස සඳහා 0.15ක අවම පහසුතා දර්ශකය දක්වා ඇත. ඉන් පැහැදිලි වන්නේ අපේක්ෂකයන්ගෙන් 15%ක සුළු පිරිසකට පමණක් එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සැපයීමට හැකි වුව ද අපේක්ෂකයන්ගෙන් 85%කට එම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සැපයීමට නොහැකි වූ බව යි.

### 1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය




මෙහි මුල් ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද මෙම ප්‍රස්තාරයට අනුව ප්‍රශ්න අංක 1 සඳහා 97%ක් ද ප්‍රශ්න අංක 4 සඳහා 83%ක් ද පිළිතුරු සපයා ඇත. ප්‍රශ්න අංක 5, 6, 7 අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර ප්‍රශ්න අංක 7 සඳහා 52%ක් ද ප්‍රශ්න අංක 5 සහ 6 සඳහා පිළිවෙළින් 18%ක් හා 15%ක් ද වශයෙන් පිළිතුරු සපයා ඇත.

ප්‍රස්තාරය 5 (RD/16/02/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




ප්‍රශ්න අංක 1 සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 18%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 23%කි.

ප්‍රස්තාරය 6 (RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

**5, 6, 7** ප්‍රශ්න අතුරෙන් අපේක්ෂකයන්ට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වී ඇත්තේ හත්වන ප්‍රශ්නය සඳහා ය. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10න් ලකුණු 7ට වැඩියෙන් ලබා ඇති ප්‍රතිශතය 48%කි. එනම් එම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් හරි අඩකට ආසන්න සංඛ්‍යාවක් ලකුණු 7ට වැඩියෙන් ලබා ඇත.

### 1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

**අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018**
**21 - සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය**
**එක් එක් ප්‍රශ්නයේ කොටස්වල/අනුකොටස්වල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 7 (RD/16/04/OL පෝර්මයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා - ප්‍රශ්න අංකය 1 **(ii)** (අ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.87කි. එනම් එහි පහසුතාව 87%කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 87%ක් එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති බව ය. අවම පහසුතාව ප්‍රශ්න අංක 2**(ii)** (ආ) අනුකොටස සඳහා දක්වා ඇත. එහි පහසුතා දර්ශකය 0.1ක් වන අතර එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 10%ක පිරිසකට එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සැපයිය හැකි වුව ද අපේක්ෂකයන්ගෙන් 90%කට එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සැපයීමට නොහැකි වූ බව යි.

## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතුරෙන් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙක ම අපේක්ෂකයන්ට එකවර ලබා දෙන අතර එම පත්‍ර දෙක සඳහා නියමිත කාලය **පැය තුනකි**. මේ සඳහා අමතර කියවීම් කාලය මිනිත්තු 10ක් ලබා දී ඇත. සිංහල සාහිත්‍ය කුසලතා මැනීම III පත්‍රයෙන් අපේක්ෂිත ය. ඒ සඳහා නියමිත කාලය **පැය දෙකකි**.

**අවසාන ලකුණු ගණනය කිරීම**

| | | | |
|---|---|---|---|
| I පත්‍රය සඳහා | - | ලකුණු | 40 |
| II පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| III පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| එකතුව | - | ලකුණු | 200 |
| අවසාන ලකුණ | - | 200 ÷ 2 = 100 | |

## 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**I , II පත්‍ර - කාලය පැය 03 (අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.)**

I පත්‍රය - බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය - ප්‍රශ්න 05කි. (මුළු ලකුණු 80කි.)
ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

| | | |
|---|---|---|
| 1 ප්‍රශ්නය : | කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි. | |
| 2 ප්‍රශ්නය : | රචනා ලිවීම. (ලකුණු 25කි.) (ව්‍යුහගත තේමා 4ක් අතුරෙන් එකක් තෝරා ගත යුතු ය.) | |
| 3 ප්‍රශ්නය : | සාරාංශකරණය | (ලකුණු 10කි.) |
| 4 ප්‍රශ්නය : | අවබෝධය | (ලකුණු 10කි.) |
| 5 ප්‍රශ්නය : | ප්‍රායෝගික ලේඛනය (වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු ය.) | (ලකුණු 15කි.) |

### 2.1.2 I ප්‍රශ්න පත්‍රය

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** ඔහු අදහස් ප්‍රකාශ කළේ **උගුරට හොරා බෙහෙත් කන්නා සේ** ය.
(1) කිසිවකුට නොදැනෙන්නාක් මෙන්
(2) උගුරට නොදැනෙන පරිදි බෙහෙත් ගිලින්නාක් සේ
(3) අනුන්ගේ බලකිරීම ඉටු කරන්නාක් මෙන්
(4) යමක් වසන් කරන්නාක් මෙන්

**2.** **අල්ලේ පැළවෙන බොරු** කීමෙන් සමහරු තම කීර්තිනාමය නැති කර ගනිති.
(1) කෙනකු රවටන බොරු බස්
(2) කෙසේ වත් විශ්වාස කළ නොහැකි දේ
(3) ඇදහීමට තරමක් දුෂ්කර කරුණු
(4) අල්ල මත පැළවෙන දේ

**3.** කියන දෙයක් **වහෙන් ඔරෝ** නො කියා කෙළින් කියන්න.
(1) ඍජු ආකාරයෙන්
(2) ඔහෙන් වරෝ යන ලෙසින්
(3) ව්‍යංග්‍යයෙන්
(4) කෙනකුට නොදැනෙන අයුරින්

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** තාරකා විද්‍යාඥයෝ උපකරණ භාවිතයෙන් ග්‍රහවස්තූන්ගේ පිහිටීම ........................ කර අනාවැකි පළ කරති.
(1) පරීක්ෂණය (2) නිරීක්ෂණය (3) අධීක්ෂණය (4) අන්වේෂණය

**5.** භාෂාවක අර්ථ ප්‍රකට කිරීමෙහි ලා .............................. ඉතා වැදගත් ය.
(1) ශබ්දෝච්චාරණය (2) සුබෝච්චාරණය (3) සාවද්‍යෝච්චාරණය (4) අනුච්චාරණය

**6.** අධ්‍යාපනයෙහි දී ..................... හිමි විය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නො ව ගුණාත්මකභාවයට ය.
(1) ප්‍රමුඛත්වය (2) ප්‍රබලත්වය (3) යෝග්‍යත්වය (4) උචිතත්වය

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අවිස්සාවේල්ල, අම්පාර, අඹේවෙල
(2) රත්නපුරය, රන්වැඹේ, රන්දෙණිගල, රතුපස්වල
(3) කඩුවෙල, කතරගම, කන්කසන්තුරේ, කල්මුනේ
(4) ගල්කිස්ස, ගල්ගමුව, ගම්පොළ, ගණේමුල්ල

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) වීරෝදාර, මර්දනය, ප්‍රතිඵල, ප්‍රස්තාවනාව
(2) දර්ශන, විමර්ශණ, සර්ෂණ, තීක්ෂ්ණ
(3) නර්ථන, නිශ්ශංකමල්ල, ලංකේශ්වර, වර්ධනය
(4) නින්දාලාප, කර්ණරසායන, සංශරණය, ප්‍රතිලාභ

**9.** එක් එක් වචනයේ **දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය** හා **ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අභූත, විවෘත, අලියා, නිවැරදි
(2) අලියා, අභූත, විවෘත, නිවැරදි
(3) විවෘත, අලියා, නිවැරදි, අභූත
(4) අලියා, අභූත, නිවැරදි, විවෘත

**10.** 'රතුපුල්' යන්න අයත් වන්නේ,
(1) අන්‍යාර්ථ සමාසයට ය.
(2) විශේෂණ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය.
(4) අව්‍යය සමාසයට ය.

**11.** උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දරුවෙක්, මම, දෙවඟනක්, ලේඛකයෝ
(2) ළමයින්, මිනිසා, වඳුරෙක්, ශිෂ්‍යාවක
(3) මා, බඹකු, නයෙක්, ගුරුවරු
(4) ධාවකයෙක්, නිළියක්, තා, දිවියෙක්

**12.** 'ප්‍රසංග + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) ප්‍රාසාංගික (2) ප්‍රසාංගික (3) ප්‍රාසංගික (4) ප්‍රසංගික

**13.** "භයානක වග වලස් ආදීහු වනයෙහි ඔබ-මොබ සැරි සරති." යන වාක්‍යයේ 'වනයෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ (2) ආධාර (3) සම්ප්‍රදාන (4) කර්ම

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

**14.** වත්මන් තරුණ පරපුරට සාහිත්‍ය මූලධර්ම පිළිබඳ **පෑවුල** අවබෝධයක් නැත.

(1) ප්‍රමාණවත් (2) පරිණත (3) පළල් (4) ගැඹුරු

**15.** යුද්ධයෙන් දිනීමට නම් සතුරු සේනා **මුලෝත්පාටනය** කළ යුතු ය.

(1) ඝාතනය (2) මුලිනුපුටා දැමීම

(3) උදුරා දැමීම (4) ඡේදනය

**16.** 'ව' යනු **දන්තෝෂ්ඨජ** අක්ෂරයකි.

(1) දත්වලින් හටගන්නා (2) තොල්වලින් හටගන්නා

(3) දත්වලින් හා බොටුවෙන් හටගන්නා (4) දත්වලින් හා තොල්වලින් හටගන්නා

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - සිරිමත්, දිරිමත්, කුල්මත්, ඉසුරුමත්

(2) සන්ධි - නිලුපුල්, වමත, දබරැඟිල්ල, පුරඟන

(3) කෘදන්ත - නැටිලි, පැනිලි, දිවිලි, විමසිලි

(4) විධික්‍රියා - බලව, කරව්, කියග, දුව

**18.** දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පේළිය තෝරන්න.

(1) ලෝපය, ආදේශය, ආගමය, දීර්ඝය (2) කණ්ඨජ, අණ්ඩජ, තාලුජ, මූර්ධජ

(3) ත්‍රිකෝණය, චතුරස්‍රය, රොම්බසය, ෂඩාස්‍රය (4) පුස්තකය, පරිච්ඡේදය, ඡේදය, වාක්‍යය

**19.** එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) කත - කාන්තාව, සියපත - නෙලුම, පර්වතය - ගිරි, නුවණ - ඇස

(2) කුරුල්ලා - විහඟ, ශාස්ත්‍රය - ධර්මය, වත - මුහුණ, මත්ස්‍යයා - මසු

(3) වෙළෙන්දා - වාණිජ, රථය - රිය, දෙවියා - අසුර, අත - බාහු

(4) වෘක්ෂය - ගස, මල - පුෂ්පය, අලුයම - ප්‍රභාතය, හිස - ශීර්ෂය

**20.** මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) භූමි - පොළොව, පඨවි, මිහි, ධරණී (2) සූර්යයා - රවි, හිරු, දිනකර, දිනිඳු

(3) මුහුද - සයුර, ජලනිධි, සමුද්‍රය, කරදිය (4) සුළඟ - වායු, නල, වාතය, පවන

**21.** **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.

(1) ප්‍රබුද්ධ - සුප්‍රබුද්ධ (2) ආගමන - විගමන

(3) ශත්‍රු - මිත්‍ර (4) උක්ත - අනුක්ත

**22.** **මිශ්‍ර ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) සංචාරකයා සමින් මැසූ පාවහන් පැලඳ ගමන් කළේ ය.

(2) අසරණ දරුවා සිඟා ගත් බත් කමින් සිටියේ ය.

(3) බන්ධනාගාර නිලධාරියා සිරකරුවා යකඩ දම්න් බැඳ එතැනට ගෙන ආවේ ය.

(4) දුටුගැමුණු රජතුමා 'ස්වර්ණමාලී' නමින් මහාථූපය නම් කළේ ය.

**23.** **වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'රේඵය' වෙනුවට 'ර්' යන්න යෙදිය හැකි ය.

(2) 'අසම්භාව්‍ය ක්‍රියාව' කාලාර්ථයේ මෙන් ම අනියමාර්ථයේ ද යෙදේ.

(3) 'නටමි' යනු වර්තමාන කාල, උත්තම පුරුෂ ඒක වචන ආඛ්‍යාත පදයකි.

(4) 'ඓතිහාසික' යන වචනය මෙන් ම 'ඓෛතිහාසික' යන්න ද නිවැරදි ය.

**24.** දන්තජ අක්ෂර පමණක් අන්තර්ගත වචනය තෝරන්න.
(1) සැනසුම (2) ලස්සන (3) දවස (4) තනතුර

**25.** පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථ කර්තෘ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) ද්‍යා ච වි ව කි ත් ක්‍ර (2) ගි ල අ ව න කු න් ය
(3) ර් සේ ධ න ම (4) ගෝ කු එ මි රු

● අංක **26** හා **27** ප්‍රශ්න යටතේ දී ඇති **ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

**26.** වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටුණා වාගේ
(1) දේවාලය දිරා ගොස් තිබූ නිසා හිස මත කඩා වැටීම
(2) යම් පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට එය ඉටු නොවීම
(3) එක් කරදරයක් අතරතුර තවත් කරදරයකට මුහුණ දීම
(4) පිහිටක් බලාපොරොත්තුවෙන් ගිය විට තවත් විපතකට මුහුණ පෑම

**27.** ඉබ්බන්ගෙන් පිහාටු ගන්නවා වාගේ
(1) ලබා ගත නොහැකි දෙයකට බලාපොරොත්තු තැබීම
(2) ඉතා අමාරුවෙන් යමක් ලබා ගැනීම
(3) නැති දෙයක් කෙසේ හෝ ලබා ගැනීම
(4) සඟවාගෙන තිබෙන දෙයක් ඉල්ලා ගැනීම

**28.** A - දැස - ස්වරාදේශ සන්ධිය
B - පොල්ලත්ත - පරරූප සන්ධිය
C - මලසුන - ස්වර සන්ධිය
D - මුනිතුමා - පූර්ව ස්වර ලෝප සන්ධිය
A, B, C, D යෙදුම් අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

● අංක **29** හා **30** යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) මම ද නංගී ද මල්ලී ද ගමට යති. (2) මම ද නංගී ද මල්ලී ද ගමට යමු.
(3) මම ද නංගී ද මල්ලී ද ගමට යයි. (4) නංගී ද මල්ලී ද මම ද ගමට යමි.

**30.** (1) ගායකයෝ ගී නො ගයති'යි පිරිස හූ කීහ.
(2) දරුවන් පිණිස යමක් කරන්නැ'යි නගරාධිපතිතුමා ඉල්ලා සිටියහ.
(3) සියලු ජාතීන් සාමයෙන් ජීවත් වෙත්වා!
(4) එදිරිවීර සරච්චන්ද්‍ර දක්ෂ නාට්‍යකරුවකු මෙන් ම ප්‍රකට නවකථා රචකයෙක් ද විය.

**31.** A - පොදු ජනයාගේ දැන ගැනීම ..................... මේ පත්‍රිකාව බෙදා හරිමි.
B - ගුරුවරුන් එතැනට පැමිණි ........................ ශිෂ්‍යයෝ අරගලය නතර කළහ.
C - ගුත්තිල පඬිතුමා, මූසිල දරුවකු ..................... රැක බලා ගත්තේ ය.
D - කොග්ගල මහා ප්‍රාඥයා ........................ මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය රචනා කළේ ය.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
E - මෙන් F - උදෙසා G - හෙවත් H - නිසා
(1) H, E, F, G (2) F, E, G, H (3) F, H, E, G (4) F, E, H, G

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං ඉඳ හිට වෙල පැත්තට යනවා"
(1) මම කලාතුරකින් කුඹුර දෙසට යමි.
(2) මම බොහෝ කලකට පසු කුඹුරට යමි.
(3) මම ඉඳ හිට කුඹුර දෙසට ගොස් පැමිණෙමි.
(4) මම මාස කිහිපයකට පසු ව කුඹුරට යමි.

**33.** 'හඳ සහ නිව්යෝර්ක් නුවර' නමැති පද්‍ය නිර්මාණය

(1) ගුණදාස අමරසේකරගේ ය. (2) මහගම සේකරගේ ය.
(3) විමල් දිසානායකගේ ය. (4) පරාක්‍රම කොඩිතුවක්කුගේ ය.

**34.** **රූපකයක් රහිත** වරණය තෝරන්න.

(1) රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදී
(2) කුරා කුහුඹු මිනිස් යන්ත්‍ර
(3) මී දේ දුව ඉසට නැඟු ව - ඉඳුනිල් මිණි සේසතක් ය
(4) මිහිලිය නළලේ අංජන තිලකේ

**35.** "හිරි ඔතප් ලද නියාවට කාරණ පෑවා සේ වාලධිය අමුඩු හස්සෙහි ගන්වා" යන පාඨයෙහි 'වාලධිය' යන වචනයේ අර්ථය කුමක් ද?

(1) පසු පස කකුල (2) කන්දෙක
(3) අමුඩය (4) වල්ගය

**36.** පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.

"පෙර විරුවන් ඔබගෙ පුතේ
ඉදි කළ වැව් බලන් පුතේ
..................................
ඒ මහ වැව් බැඳුණෙ පුතේ"

(1) දැ උරුමය ඇතිව සිතේ
(2) දැතේ සවියෙනුයි පුතේ
(3) සුරුවිරුකම් ඔබට ඇතේ
(4) මවු බිම දෙස බලන් පුතේ

**37.** "ඔන්න මං ගැටය කාලෙ නං නේරු අගමැතිතුමා ඉස්සරහ, මහ රැජින ඉස්සරහ, සියං කුමාරයා ඉස්සරහ නැටුං නටල ප්‍රශංසා ලබලා තියෙනවා" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(1) තල මල පිපිලා (2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු (4) ගුරුතරුව

**38.** හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'වාංපතුල්' යනු,

(1) මර උගුල් ය. (2) වඳුරන්ගේ පාදයන් ය.
(3) පාවහන් ය. (4) සතුන්ගේ හම්පොතු ය.

**39.**

"උදුළ සොම් කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ"

යන කවියෙන් කියැවෙන්නේ,

(1) වන වැනුමක් ගැන ය. (2) හිරු බැස යන අවස්ථාවක් ගැන ය.
(3) රජකුගේ සිරි යහනක් ගැන ය. (4) නිශා වර්ණනයක් ගැන ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"මතු පිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංග්‍යාර්ථය ද අවබෝධ කළ යුතු ය. බසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නො ව හෘදයගෝචර වන කොටස ද දත යුතු ය."

(1) වචනාර්ථය හා ව්‍යංග්‍යයෙන් කියවෙන අර්ථ අවබෝධ කළ යුතු අතර හදවතට හා බුද්ධියට ගෝචර වන කොටස් දැන ගැනීම ප්‍රමාණවත් ය.
(2) මතු පිටින් පෙනෙන අර්ථ හා ව්‍යංග්‍යයෙන් කියැවෙන කොටස් අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර ෲ හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.
(3) වචනයේ මතු පිට අර්ථය මෙන් ම ව්‍යංග්‍යයෙන් කියැවෙන අර්ථය ද බුද්ධියට ගොදුරු වන කොටස මෙන් ‹ හදවතට ගොදුරු වන කොටස ද අවබෝධ කර ගත යුතු ය.
(4) මතු පිටින් පෙනෙන වචනාර්ථය අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.

### 2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...4.... | 21. | ...1.... |
| 02. | ..2.... | 22. | ...2.... |
| 03. | ...3.... | 23. | ...4.... |
| 04. | ...2.... | 24. | ...2.... |
| 05. | ...1.... | 25. | ...3.... |
| 06. | ...1.... | 26. | ...4.... |
| 07. | ...3.... | 27. | ...1.... |
| 08. | ...1.... | 28. | ...2.... |
| 09. | ...4.... | 29. | ...2.... |
| 10. | ...2.... | 30. | ...2.... |
| 11. | ...1.... | 31. | ...3... |
| 12. | ...3.... | 32. | ...1.... |
| 13. | ...2.... | 33. | ...2.... |
| 14. | ...3.... | 34. | ...1.... |
| 15. | ...2.... | 35. | ...4.... |
| 16. | ...4.... | 36. | ...2.... |
| 17. | ...1.... | 37. | ...1.... |
| 18. | ...2.... | 38. | ...3.... |
| 19. | ...4.... | 39. | ...4.... |
| 20. | ...3.... | 40. | ...3.... |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)




| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව | |
|---|---|---|---|---|
| | ප්‍රශ්න අංකය | පහසුතාව | ප්‍රශ්න අංකය | පහසුතාව |
| භාෂා කුසලතා | 06 | 88% | 14 | 10% |
| ව්‍යාකරණ | 09 | 92% | 17 | 15% |
| භාෂා සාහිත්‍යය | 34 | 22% | 39 | 8% |
| විශ්ලේෂණය හා අවබෝධය | 36 | 90% | 33 | 29% |




භාෂා කුසලතා යන තේමාව යටතේ සම්පාදිත හයවන ප්‍රශ්නයෙහි පහසුතාව 88%කි. දාහතරවන ප්‍රශ්නයට 10%ක අඩු ම පහසුතාව දක්වා ඇත.

ව්‍යාකරණ යටතේ වැඩි ම පහසුතාව පෙන්නුම් කර ඇත්තේ නවවෙනි ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 92%කි. අවම පහසුතාව ලබා ඇත්තේ ප්‍රශ්න අංක 17ට වන අතර එහි පහසුතාව 15%කි.

භාෂා සාහිත්‍යය ඇසුරෙන් ප්‍රශ්න දෙකක් සැකසී තිබිණි. ඒ අතුරෙන් තිස්හතරවන ප්‍රශ්නය සඳහා 22%ක පහසුතාව ද 39 ප්‍රශ්නය සඳහා 8%ක පහසුතාව ද පෙන්නුම් කර තිබිණි.

විශ්ලේෂණය සහ අවබෝධය යටතේ අසා ඇති ප්‍රශ්න අතුරෙන් වැඩි ම පහසුතාව දක්වා ඇත්තේ තිස්හයවන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 90%කි. එහි අවම පහසුතාව ලබා තිබුණේ තිස්තුන්වන ප්‍රශ්නය යි. එය 29%කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි මධ්‍යක පහසුතාව 54%කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) (සිංහල)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය | ප්‍රතිචාර නො දැක්වූ |
| 1 | 4 | 53.95% | 3.47% | 4.74% | 37.4% | 0.44 |
| 2 | 2 | 11.01% | 84.15% | 3.8% | 0.83% | 0.2 |
| 3 | 3 | 8.11% | 2.54% | 50.62% | 38.47% | 0.26 |
| 4 | 2 | 4.17% | 86.75% | 7.11% | 1.63% | 0.34 |
| 5 | 1 | 67.7% | 7.11% | 13.08% | 11.61% | 0.5 |
| 6 | 1 | 87.85% | 4.67% | 4.4% | 2.7% | 0.38 |
| 7 | 3 | 17.45% | 15.32% | 54.35% | 12.15% | 0.73 |
| 8 | 1 | 34.73% | 13.81% | 35.64% | 15.25% | 0.57 |
| 9 | 4 | 1.63% | 3.2% | 2.74% | 92.03% | 0.4 |
| 10 | 2 | 14.11% | 62.26% | 14.65% | 8.38% | 0.6 |
| 11 | 1 | 55.06% | 9.64% | 5.94% | 28.86% | 0.5 |
| 12 | 3 | 26.86% | 9.54% | 17.62% | 45.68% | 0.3 |
| 13 | 2 | 21.79% | 48.95% | 14.65% | 14.11% | 0.5 |
| 14 | 3 | 27.03% | 15.62% | 10.24% | 46.71% | 0.4 |
| 15 | 2 | 33.07% | 60.36% | 3.74% | 2.54% | 0.29 |
| 16 | 4 | 6.77% | 12.11% | 6.91% | 73.84% | 0.37 |
| 17 | 1 | 15.45% | 20.45% | 24.16% | 39.51% | 0.43 |
| 18 | 2 | 41.54% | 41.07% | 7.21% | 9.44% | 0.74 |
| 19 | 4 | 35.47% | 16.65% | 15.82% | 31.7% | 0.36 |
| 20 | 3 | 21.45% | 17.25% | 42.81% | 18.05% | 0.44 |
| 21 | 1 | 47.21% | 3.44% | 47.18% | 1.9% | 0.27 |
| 22 | 2 | 7.81% | 64.5% | 18.99% | 8.04% | 0.66 |
| 23 | 4 | 18.75% | 7.51% | 13.08% | 60.33% | 0.33 |
| 24 | 2 | 7.21% | 29.46% | 26.99% | 35.5% | 0.84 |
| 25 | 3 | 5.77% | 9.18% | 72.84% | 11.71% | 0.5 |
| 26 | 4 | 1.07% | 2.9% | 11.44% | 84.32% | 0.27 |
| 27 | 1 | 75.44% | 13.25% | 8.98% | 2.07% | 0.26 |
| 28 | 2 | 8.51% | 43.28% | 22.36% | 25.19% | 0.66 |
| 29 | 2 | 23.29% | 30.96% | 11.85% | 33.53% | 0.37 |
| 30 | 4 | 9.84% | 12.85% | 35.87% | 41.04% | 0.4 |
| 31 | 3 | 2.57% | 3.7% | 89.86% | 3.64% | 0.23 |
| 32 | 1 | 71.74% | 5.17% | 20.35% | 2.47% | 0.27 |
| 33 | 2 | 20.35% | 29.3% | 23.92% | 25.86% | 0.57 |
| 34 | 1 | 22.46% | 22.32% | 29.8% | 24.82% | 0.6 |
| 35 | 4 | 21.09% | 9.88% | 7.57% | 60.99% | 0.47 |
| 36 | 2 | 3.37% | 90.39% | 2.74% | 3.24% | 0.26 |
| 37 | 1 | 51.05% | 24.06% | 5.07% | 19.29% | 0.53 |
| 38 | 3 | 14.15% | 9.81% | 69.67% | 5.91% | 0.46 |
| 39 | 4 | 39.51% | 32.53% | 19.25% | 8.41% | 0.3 |
| 40 | 3 | 7.61% | 30.63% | 50.22% | 10.98% | 0.56 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාෂා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහට ම විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍ර දෙකට ම හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත්, සාමාන්‍යයෙන් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවෙහි ප්‍රස්තාර 1හි දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න හතළිහ අතුරෙන් 9 ප්‍රශ්නයෙහි පහසුතාව 92%කි. ඊට හේතුව වී ඇත්තේ පිලි භාවිතය පිළිබඳ මනා අවබෝධයක් අපේක්ෂකයන් සතු වීමයි. 31 හා 36 යන ප්‍රශ්නවල පහසුතාව 90% බැගිනි. එවැනි ඉහළ ප්‍රතිශතයක් ලබා ගැනීමට අපේක්ෂකයන් සමත් වී ඇත්තේ නිපාත භාවිතයට ඇති ඉහළ හැකියාවත්, නිවැරදි ලෙස අදාළ පද්‍ය පාදය තෝරා ගැනීමේ ඇති දක්ෂතාවත් නිසා ය. පහසුතාව 75% ඉක්ම වූ අනෙකුත් ප්‍රශ්න ලෙස ප්‍රශ්න අංක 2, 4, 6, 26 හා 27 දැක්විය හැකි ය. ඉහත ප්‍රශ්න පහසුතාව අතින් ඉහළ ම ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒවා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ නිරතුරු ව භාවිත වන යෙදුම් හා වචන ඇතුළත් ප්‍රශ්න වීම ඊට හේතුව යි.

ප්‍රශ්න අංක 3, 5, 7, 10, 11, 15, 16, 22, 23, 25, 32, 35, 37, 38, 40 යන ප්‍රශ්නවල පහසුතාව 50%-75% අතර ප්‍රාන්තරයට අයත් වේ. ඉතිරි ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිසුනට පහසු වී ඇත.

ප්‍රශ්න අංක 1, 8, 13, 18, 19, 20, 21, 28, 29, 30 යන ප්‍රශ්නවල පහසුතාව 30%ත් 50%ත් අතර ප්‍රාන්තරයට අයත් වේ.

ප්‍රශ්න අංක 12, 14, 17, 24, 33, 34, 39 යන ප්‍රශ්නවල පහසුතාව 30% වඩා අඩු වී ඇත. 39 ප්‍රශ්නයේ පහසුතාව 8%කි. පද්‍යයක් කියවා එහි මූලික අදහස් ග්‍රහණය කර ගැනීමට ඇති නොහැකියාව එවැනි අඩු පහසුතාවක් පෙන්නුම් කිරීමට හේතුවකි. එමෙන් ම 14 ප්‍රශ්නයේ පහසුතාව 10%කි. 17 ප්‍රශ්නයේ පහසුතාව 15%ක් ද, 12 ප්‍රශ්නයේ පහසුතාව 18%ක් ද වේ. මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා පොත පත පරිශීලනය කෙරෙහි ශිෂ්‍යයන් පෙලඹවීම උචිත ය.

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න හතළිහ පහත සඳහන් පරිදි ප්‍රධාන තේමා හතරක් යටතේ වර්ගීකරණය කළ හැකි වෙයි.

| තේමාව | ප්‍රශ්න සංඛ්‍යාව | තේමාවට ඇතුළත් ප්‍රශ්න අංක |
|---|---|---|
| 1. භාෂා කුසලතා | 15 | 1, 2, 3, 4, 5, 6, 14, 15, 16, 19, 20, 21, 26, 27, 38 |
| 2. ව්‍යාකරණ | 16 | 7, 8, 9, 10, 11, 12, 13, 17, 22, 23, 24, 28, 29, 30, 31, 32 |
| 3. භාෂා සාහිත්‍යය | 2 | 34, 39 |
| 4. විශ්ලේෂණය හා අවබෝධය | 7 | 18, 25, 33, 35, 36, 37, 40 |

**භාෂා කුසලතා**

භාෂා කුසලතා යටතේ ඇති 1, 2, 3 ප්‍රශ්න සඳහා යොදා ගෙන ඇත්තේ සාම්ප්‍රදායික යෙදුම් ය. එහි පළමු වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයූ ප්‍රතිශතය 37.4%කි. වැඩි පිරිසකට එයට නිවැරදි පිළිතුර සැපයීමට නොහැකි වී ඇත්තේ රූඪියෙහි වඩාත් ම සමීප අර්ථය සහිත අදහස තෝරා ගැනීමට ඇති නොහැකියාව යි. මෙම ගැටලුවට පිළියම් ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවස්ථෝචිත ව සාම්ප්‍රදායික යෙදුම් භාවිත කළ යුතු ය.

ප්‍රශ්න අංක 4, 5, 6 සඳහා නිවැරදි පිළිතුරු සැපයූ ප්‍රතිශතය පිළිවෙළින් 86.75%, 67.7%, 87.85%කි. ඒ අනුව මෙම හැකියාව තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා නිතර පරිශීලනයට උචිත වචන හා අර්ථ සහිත පොත් පිංචක් නිර්මාණයට සිසුන් යොමු කළ යුතු ය.

දාහතරවන ප්‍රශ්නයේ "පෘථුල" යන වචනයේ නිවැරදි අර්ථය තෝරා ගෙන ඇත්තේ 10.24%කි. 15 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීමේ සම්භාවිතාව 60% ඉක්ම වුව ද එය ද ප්‍රමාණවත් නො වේ. මේ දුබලතා මගහැරවීමට නම් විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ ලියවුණු පොතපත පරිශීලනයට සිසුන් යොමු කළ යුතු ය.

ප්‍රශ්න අංක 19, 20, 21 යන ප්‍රශ්නවලින් විමසනුයේ සමානාර්ථ පද සහ විරුද්ධාර්ථ පද පිළිබඳ දැනුම යි. මෙම ප්‍රශ්න සඳහා ද නිවැරදි පිළිතුරු තේරීමේ ප්‍රවණතාව දුර්වල මට්ටමක පැවතිණි. භාෂා කුසලතා පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම ප්‍රමාණවත් නොවන බැවින් මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා අතිරේක පොතපත පරිශීලනයට යොමු කරවීමටත්, වාක්කෝෂය පිළිබඳ දැනුම පුළුල් කිරීමටත් සුදුසු අභ්‍යාසවල නිරත කරවීම අවශ්‍ය ය.

**ව්‍යාකරණ**

ප්‍රශ්න අංක 8 අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම මැන බැලෙන්නකි. එයට නිවැරදි පිළිතුර තෝරා ගෙන ඇත්තේ, 34.73%ක් වැනි අවම පිරිසකි. මේ ප්‍රතිශතය ඉහළ නංවා ගැනීම සඳහා අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම තහවුරු කිරීමට ශිෂ්‍යයන් සතතාභ්‍යාසයේ යෙදවීම උචිත ය.

"ඉක" ප්‍රත්‍යය භාවිත කිරීමේ රටා නිරවුල් ව හා නිවැරදි ව වටහා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් අල්ප ප්‍රමාණයකි. එම නිසා 12 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 17.62%කි. විවිධ තද්ධිත ප්‍රත්‍යය ගැන්වීමෙන් සෑදෙන පද එකතුවක් සකසා ඒවා මතක තබා ගැනීමට යොමු කිරීම මගින් මෙම ප්‍රතිශතය ඉහළ නංවා ගත හැකි ය.

දහ හත්වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු තෝරා ගැනීමේ ප්‍රතිශතය 15.45%කි. එසේ වීමට හේතු වී ඇත්තේ තද්ධිත, සන්ධි, කෘදන්ත හා විධික්‍රියා පිළිබඳ දැනුම අල්පවීම යි. මෙම ප්‍රතිශතය වර්ධනය කරගැනීම සඳහා නව ඉගෙනුම් ක්‍රමශිල්ප භාවිතයෙන් ව්‍යාකරණමය දැනුම පුළුල් කිරීමේ ක්‍රමවේද අනුගමනය කිරීම වඩාත් යෝග්‍ය වේ.

අකුරු උපදින ස්ථාන පිළිබඳ ඇති අනවබෝධය නිසා ම 24 ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීමේ හැකියාව 29.46%ක් වී ඇත. මේ ගැටලුව මගහරවා ගැනීමට නම් 10, 11 ශ්‍රේණිවල පෙළපොත්හි අදාළ පාඩම්වල අන්තර්ගත කරුණු තහවුරු වන සේ අභ්‍යාසවල නිරත කරවීම සුදුසු ය.

නිවැරදි පිළිතුරු සැපයීමේ හැකියාව 29 හා 30 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 30.96%ක් හා 12.85%ක් වැනි අඩු අගයක් ගැනීමට හේතුව වාක්‍ය රීති පිළිබඳ නිවැරදි අවබෝධය තහවුරු වී නොමැතිකම යි. මේ සඳහා නිරන්තරයෙන් ම උක්ත ආඛ්‍යාත සම්බන්ධ වාක්‍ය රීති පිළිබඳ අභ්‍යාසවල නිරත කරමින්, ඒවා සිසුන් සමග සාකච්ඡා කරමින් සමාලෝචන ක්‍රියාවලියක් තුළ ප්‍රතිපෝෂණ වැඩසටහන් අනිවාර්යයෙන් ම ක්‍රියාත්මක කළ යුතු ය.

**භාෂා සාහිත්‍යය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ භාෂා සාහිත්‍යය තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ 34 හා 39 යන ප්‍රශ්න දෙක පමණි. මෙම තේමාව සඳහා බර තැබීම 5%කි. 34 ප්‍රශ්නය රූපක මූලික කරගත් ප්‍රශ්නයක් වන අතර එහි පහසුතාව 22%කි. මින් තහවුරු වන්නේ අපේක්ෂකයන්ට කාව්‍යාලංකාර වටහා ගැනීමේ අපහසුතාවක් ඇති බව යි. පෙළපොත්හි ඇති පද්‍ය පන්ති රස විඳීමේ දී එහි ඇති කාව්‍යාලංකාර මතුකර පෙන්වා දීමට ගුරුවරුන්ගේ අවධානය යොමු විය යුතු ය.

තිස්නවවන ප්‍රශ්නයේ පහසුතාව 8%ක් තරම් පහළ අගයක් ගැනීමට හේතු වී ඇත්තේ කාව්‍යයක අර්ථාවබෝධ කර ගැනීමට ඇති නොහැකියාව යි. මෙම තත්ත්වය මගහරවමින් ඉහළ ප්‍රතිශතයක් ලබා ගැනීමට නම් පද්‍ය පන්ති රස විඳීමට එහි තේමාව හා අර්ථාලංකාර පිළිබඳ ව නිරවුල් ව පැහැදිලි කරදීමට ගුරුවරයා සමත් විය යුතු ය.

**විශ්ලේෂණය හා අවබෝධය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි විශ්ලේෂණය හා අවබෝධය යටතේ ප්‍රශ්න 7ක් ඇතුළත් වී තිබිණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 17.5%ක බර තැබීමක් සිදු කර තිබිණි. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් වැඩි ම පහසුතාව 90%ක් හිමි වී ඇත්තේ 36 ප්‍රශ්නයට යි. මෙම තේමාව යටතේ දුෂ්කර ම ප්‍රශ්නය ලෙස ප්‍රශ්න අංක 33 දැක්විය හැකි ය. එම ප්‍රශ්නයේ පහසුතාව 29%කි. පෙළපොත පරිශීලනය නිසියාකාරව සිදු නොවීම ඊට හේතුව යි. සාහිත්‍ය කෘති හා නිර්මාණකරුවන්ගේ නම් ඇතුළත් පුවරුවක් සකසා පන්තියේ ප්‍රදර්ශනය කරමින් නිරතුරු ව ශිෂ්‍ය අවධානය ඒ දෙසට යොමු කරවීමට ගුරුවරයා කටයුතු කළ යුතු ය.

ප්‍රශ්න අංක 37 හා 40 සඳහා පිළිවෙළින් නිවැරදි පිළිතුරු සැපයීමේ පහසුතාව 51%ක් හා 50%කි. නිර්දිෂ්ට වේදිකා නාට්‍යය පිළිබඳ පවතින දැනුම වැඩි දියුණු කිරීමට හා කිසියම් ගද්‍ය පාඨයක් කියවා එහි අර්ථ ග්‍රහණය කර ගැනීමට හැකි වන සේ ඒ අනුසාරයෙන් විවිධ ක්‍රියාකාරකම් පන්ති කාමරයේ දී ක්‍රියාත්මක කිරීමට උත්සුක විය යුතු ය.

| තේමාව | තේමාවට ඇතුළත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව | බර තැබීම | තේමාවේ පහසුතාව |
|---|---|---|---|
| 01. භාෂා කුසලතා | 15 | 37.5% | 61% |
| 02. ව්‍යාකරණ | 16 | 40% | 51% |
| 03. භාෂා සාහිත්‍යය | 02 | 5% | 15% |
| 04. විශ්ලේෂණය හා අවබෝධය | 07 | 17.5% | 57% |

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි සමස්ත පහසුතාව 54%ක් වේ. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අපේක්ෂකයන් සමස්තයක් වශයෙන් ගත් කල ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකි ව තිබූ උපරිම ලකුණුවලින් 54%ක් පමණි. එයින් ගම්‍ය වන්නේ සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙන් ඉහළ ලකුණු ලබා ගැනීමට අපේක්ෂකයන්ට පහසු වී නොමැති බව යි.

**I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන්ගෙන් නිරූපිත දුර්වලතා**

* පෙළපොත නිසි පරිදි පරිශීලනය නොකිරීම
* සිංහලයේ භාවිත වන තත්සම වචනවල අර්ථාවබෝධය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම
* ලේඛනයේ දී හා භාෂණයේ දී සාම්ප්‍රදායික යෙදුම් උචිත පරිදි භාවිතයට ඇති අසමත්කම
* අක්ෂර වින්‍යාස රීති පිළිබඳ නිවැරදි දැනුම හා අවබෝධය අවම වීම
* ව්‍යාකරණ අංග පිළිබඳ අවබෝධය දුර්වල වීම
* භාෂා කුසලතා පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නොමැති වීම
* චතුර්විධ භාෂා කුසලතා නිසි පරිදි සංවර්ධනය වී නොතිබීම

**දුර්වලතා අවම කර ගැනීම සඳහා යෝජනා**

* පෙළපොත් භාවිතය සඳහා වැඩි නැඹුරුවක් ඇති වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම
* මාතෘ භාෂාවලින් සිංහල භාෂාවට ලැබී ඇති වචන හා ඒවායෙහි තේරුම් සහිත ගොනුවක් ශිෂ්‍යයන් ලවා සකස් කරවීම
* සාම්ප්‍රදායික යෙදුම් උචිත පරිදි හැකි සෑම විට ම භාවිත කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදීම
* නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පුවරු ප්‍රදර්ශනය කිරීම හා පෙළපොතේ අක්ෂර වින්‍යාසයට අදාළ න, ණ, ළ, ල, ශ, ෂ, ස අක්ෂර සහිත වචන ගොනු කිරීම, මහප්‍රාණ අක්ෂර, සඤ්ඤක අක්ෂර සහිත වචන පෙළගැස්වීමට යොමු කිරීම
* ලේඛනයේ දී ශිෂ්‍යයන් අතින් සිදුවන අක්ෂර වින්‍යාස දෝෂ පෙන්වා දී ඒවා නිවැරදි කර වාර කිහිපයක් එම වචන ලියවීම

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **පහකින්** සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

1. ප්‍රශ්නය : භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ අනුප්‍රශ්න 10කින් සමන්විත වේ.
එක් අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි.

2. ප්‍රශ්නය : ව්‍යුහගත තේමා හතරක් අතුරෙන් එකක් තෝරා ගෙන, දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යුහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනා ගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 25කි.

3. ප්‍රශ්නය : පාඨයක, සාරාංශය, නියමිත වචන සීමාව තුළ ලිවිය යුතු ය.
පාඨයක ඇතුළත් කරුණු සංශ්ලේෂණය කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10කි.

4. ප්‍රශ්නය : ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු ය. අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10කි.

5. ප්‍රශ්නය : දී ඇති විස්තර පදනම් කරගෙන අත් පත්‍රිකාවක් සකස් කිරීම හෝ අදාළ තොරතුරු ඇසුරෙන් පුවත්පත් වාර්තාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 15කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

**2.2.2 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, අංක 2, 3 හා 4 ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි ඇති ප්‍රශ්න පහට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් අපේක්ෂකයන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට වන අතර අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පස්වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 96% හා 91% වේ. ප්‍රශ්න පහ අතුරෙන් පළමුවන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 96%ක් පිළිතුරු සපයා තිබූ නමුදු එම ප්‍රශ්නයෙහි පහසුතාව 50%ක් වේ. සරල ව්‍යාකරණ රීතිවලින් සමන්විත මෙම ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වේ. එහෙත් වියරණ පිළිබඳ මූලික දැනුම හා අවබෝධය අවම වීම ලකුණු අඩු වීමට හේතු වී ඇත.

අපේක්ෂකයන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත් වැඩි ම සාර්ථකත්වයක් දක්වා ඇත්තේ හතරවන ප්‍රශ්නයට ය. දී ඇති ඡේදයක් ඇසුරෙන් නගන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීමෙන් සිසුන්ගේ අවබෝධ හැකියාව මැනීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී ඇත. එහි පහසුතාව 81%ක් වීම මගින් නිගමනය කළ හැක්කේ එම ප්‍රශ්නයට අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව පහසුවෙන් හා සතුටුදායක ලෙස පිළිතුරු සැපයීමේ හැකියාව අපේක්ෂකයන් සතු වූ බවයි.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම
ව්‍යූහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.

**(අ)** වළ **(ආ)** වල

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.

"ඒ සමිතියේ සභාපතිත්වය දරණ තැනැත්තා දේශදේශාන්තරයෙහි කීර්තියක් ඇති අග්‍රගන්‍ය පඬිවරයෙකි."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා, සන්ධි වර්ගය නම් කරන්න.

**(අ)** සහ + උදර **(ආ)** රුක් + අත්තන

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **උපසර්ග පද දෙකක්** උපුටා දක්වන්න.

"අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රතිඵලදායක බව විදුහල්පතිතුමා පැවසීය."

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

**(අ)** පළල **(ආ)** සරල

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

**(අ)** තමාගේ ම අභිමතයට අනුව වැඩ කරන

**(ආ)** එක් ඇසක් පමණක් පෙනෙන තැනැත්තා

(vii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

**(අ)** අප සංගමයේ සභාපති නොහොත් සභාපතිනිය සභාව අමතන්නේ ය.

**(ආ)** ලාංකික ක්‍රීඩකයෝ තරගය ජය ගනීවි.

(viii) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

**(අ)** දරුවන් ගී **ගයද්දී** දෙමවුපියෝ තුටු වෙති.

**(ආ)** "**බල** සුබ නිමිති පෙරමග නැකතටත් වැඩි"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

**(අ)** පාසල් ශිෂ්‍යයා

**(ආ)** විදෙස් ප්‍රවෘත්ති

(x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද **දෙක** තෝරා වෙන වෙන ම ලියන්න.

"ගෙවල් දොරවල් බැලීමට පැමිණි තරුණයාගේ වං හුං දැනගත් මවුපියෝ ඔහුට අකැමති වූහ."

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

1.

(i) (අ) ආවාටය, පොළවේ ගැඹුරට හෑරූ / කණින ලද / ස්වභාවික ව පිහිටි ස්ථානය

(ආ) වනය, වනාන්තරය, අරණ, අටවි, කැලෑව, අරණ්‍යය

(ii) දරන, අග්‍රගණ්‍ය

(iii) සහ + උදර = සහෝදර ස්වරාදේශ සන්ධිය / සරදෙස් සඳ

රුක් + අත්තන = රුක්කත්තන ද්විත්ව රූප සන්ධිය / දෙරූ සඳ

(iv) අප, අනු, ප්‍රති (උපසර්ගය සහිත පදය උපුටා දක්වා තිබුණ ද ලකුණු දෙන්න.)

(v) (අ) පටු, දිග, දීර්ඝ, ආයාම, අයම්, අධන්

(ආ) සංකීර්ණ, සංහත

(vi) (අ) අත්තනෝමතික / හිතුවක්කාර / ස්වාභිමතය

(ආ) කණා, කාණ

(vii) (අ) අප සංගමයේ සභාපති නොහොත් සභාපතිනිය සභාව අමතන්නී ය.

අප සංගමයේ සභාපතිනිය නොහොත් සභාපති සභාව අමතන්නේ ය.

(ආ) ලාංකික ක්‍රීඩකයන් තරගය ජය ගනීවි.

(viii) (අ) අසම්භාව්‍ය ක්‍රියා / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / ආවස්ථික කෘදන්ත /ආවස්තික ක්‍රියාව

(ආ) විධි ක්‍රියා / විදි කිරිය / විධාන ක්‍රියා

(ix) (අ) පාඨශාලා ශිෂ්‍යයා, පාසල් සිසුවා / පාසල් සිසු

(ආ) විදෙස් පුවත්, විදේශීය ප්‍රවෘත්ති / විදේශ ප්‍රවෘත්ති

(x) ගෙවල් දොරවල්, වං හුං

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 96%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 34%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 16%ක් ද

ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 16% වන අතර 17%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 17කින් සමන්විත වූ අතර වැඩි ම පහසුතාව ඇත්තේ (x) වන කොටසට ය. එහි පහසුතාව 89%කි. මෙම ප්‍රශ්නයෙන් යුගල පද පිළිබඳ අවබෝධය මැනෙයි. ප්‍රායෝගික ජීවිතයේ නිරතුරුව ම භාවිත වන යුගල පද පිළිබඳ විමසා තිබීම මෙම පිළිතුරෙහි සාර්ථකත්වයට හේතු වී ඇත.

දෙවනු ව වැඩි පහසුතාව වන 83%ක් ලබා ගෙන ඇත්තේ (ix) - ආ අනුකොටසට ය. එය අනුරූපී වචන යුගල භාවිතය පිළිබඳ දැනුම මැන බැලෙන්නකි. එය අපේක්ෂකයාට වඩා පහසු වී ඇත්තේ එම අනුරූපී වචන ජන මාධ්‍ය මගින් පවා නිතර අසන්නට ද ලැබීම ය.

නමුත් එම ප්‍රශ්නයේ (අ) අනුකොටසෙහි පහසුතාව 63%ක් වීමෙන් පෙනී යන්නේ ඇතැම් අපේක්ෂකයනට අනුරූපී වචන යුගල පිළිබඳ ව පෘථුල අවබෝධයක් නොමැති බව යි.

මේ පිළිබඳ ව අපේක්ෂකයාට මනා වූ අවබෝධයක් ලබා දීමට අනුරූපී වචන යුගල ඇතුළත් ලේබන පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීම, වචන කීපයක් දී ඊට ගැළපෙන අනුරූපී වචනය හිස්තැනෙහි යෙදීමට සැලැස්වීම, පාඩමක් නම් කොට එහි ඇති අනුරූපී ශබ්ද යුගල සෙවීමට යොමු කිරීම සුදුසු වේ.

තෙවනු ව වැඩි පහසුතාව වන 72%ක් ලබා ගෙන ඇත්තේ (v) කොටස (අ) අනුකොටසට ය. විරුද්ධාර්ථ පද පිළිබඳ දැනුම මැන බැලීම මෙහි අපේක්ෂාව වුවත් එහි (ආ) අනුකොටසෙහි පහසුතාව 56%ක් වීමෙන් පෙනී යන්නේ විරුද්ධාර්ථ පිළිබඳ ව අපේක්ෂකයන් තුළ පෘථුල අවබෝධයක් නොමැති බව ය. මෙහි දී ප්‍රායෝගික ජීවිතයේ දී නිතර භාවිත වන විරුද්ධාර්ථ පද පිළිබඳ ව අපේක්ෂකයන් තම හැකියාව ප්‍රදර්ශනය කළත් නිතර භාවිත නොවන පද සඳහා විරුද්ධාර්ථ සැපයීමට ඇතැම් අපේක්ෂකයන් අපොහොසත් වී ඇති බව පෙනී යයි. එම දුෂ්කරතා මගහැරවීම සඳහා විරුද්ධාර්ථ පද ඇතුළත් වන සේ ප්‍රහේලිකා පිරවීම, පන්ති කාමරය තුළ කණ්ඩායම් තරග පැවැත්වීම, විරුද්ධාර්ථ පද ඇතුළත් පොත් පිංචක් නිර්මාණය කිරීම වැනි ක්‍රියාකාරකම් උචිත බව යෝජනා කරමු.

එමෙන් ම මෙහි (iii) හි (අ), (iv), (v) හි (අ) (ආ), (viii) හි (ආ) සහ (ix) හි (අ) යන කොටස්වල පහසුතාව 50%-72% ප්‍රාන්තරයේ පැවතුණි. ඒවා ව්‍යාකරණ අංග වන සන්ධි, උපසර්ග, ක්‍රියා පද, විරුද්ධාර්ථ පද ආදි ව්‍යාකරණාංග ආශ්‍රයෙන් සැකසී ඇත. එහි පහසුතාව ප්‍රශස්ත මට්ටමට ළඟා වෙමින් පවතින අතර එම තත්ත්වය තව දුරටත් වර්ධනය කිරීම සඳහා අපේක්ෂකයන් යොමු කරවීමට පද සන්ධි කිරීම, පද විසන්ධි කිරීම, උපසර්ග සහිත වචන හඳුනා ගැනීම, ක්‍රියාපද වර්ග හඳුනා ගැනීම හා භාවිතය සඳහා සුදුසු ක්‍රියාකාරකම්වල යෙදවීමට ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු ය.

එසේ ම මෙම ප්‍රශ්නයේ දුෂ්කර ම කොටස වී ඇත්තේ පහසුතාව 15%ක් වූ (vii)හි (අ) අනුකොටස යි. ඊට හේතු වී ඇත්තේ සිංහල භාෂාවේ වාක්‍ය රීති පිළිබඳ අපේක්ෂකයන් සතු අවබෝධය ප්‍රමාණවත් නොවීම යි.

මෙම දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා අපේක්ෂකයන් නිරන්තරයෙන් ලිවීමට සහ කියවීමට යොමු කිරීම, පෙළපොත ඇසුරෙන් වාක්‍ය රීති පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දී නිවැරදි වාක්‍ය නිර්මාණය කිරීමට යොමු කිරීම මෙන් ම පැරණි පොතපත ඇසුරින් වාක්‍ය රීති මතුකර පෙන්වීම මගින් ව්‍යාකරණ රීති පිළිබඳ සාධන මට්ටම වර්ධනය කිරීම උචිත වේ.

සෙසු අනුකොටස්වල පහසුතාව 16% සිට 44% දක්වා විසිරී ඇත. එම අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් (vi) (අ), 16%කි. (i)හි (ආ), 19%කි. (vi)හි (ආ) 30%කි. (1)හි (අ) 33%කි. (vii)හි (ආ) 38%කි. (iii)හි (ආ) 41%කි. (ii) 43%කි. (viii)හි (අ) 44%කි. පහසුතාව අඩු අගයක් ගැනීමෙන් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් බහුතරයක් එම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දීමට අසමත් වූ බව යි.

50%ට වඩා අඩු පහසුතාවක් ලබා තිබූ ඉහත ප්‍රශ්න පොදු වේ අක්ෂර වින්‍යාසය, උපසර්ග, සන්ධි, ක්‍රියාපද, යුගල පද, තනිපද, අනුරූපී පද භාවිතය, වාක්‍ය රීති යන අංගවලට අයත් ව තිබිණි. ඉහත වියරණ අංග පිළිබඳ දැනුම අපේක්ෂකයන් තුළ වර්ධනය කළ යුතු බවත් ව්‍යවහාරික භාෂාවේ යෙදෙන විශේෂිත පද පිළිබඳ නිරවුල් අවබෝධය පුළුල් කළ යුතු බවත් මෙහි දී පැහැදිලි වන කරුණකි.

භාෂා පරිචය යටතේ ලේඛන කුසලතාව, භාෂණ අවබෝධය හා විශ්ලේෂණය කිරීම, භාෂා භාවිතය, ග්‍රන්ථ පරිශීලනය හා වාක්‍ය අවබෝධය යන කරුණු මැනීම මෙයින් අපේක්ෂා කළ ද අපේක්ෂකයන් තුළ ව්‍යාකරණ පිළිබඳ ව මූලික දැනුම හීන වීමත් අවබෝධය පිළිබඳ දුර්වලතාත් දක්නට ලැබේ.

වියරණ දැනුම පිළිබඳ පහසුතාව වර්ධනය කිරීම සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනයටත්, පෙළපොත් සහ අමතර කියවීම් පොත් පරිශීලනයටත් අපේක්ෂකයන් උනන්දු කළ යුතු අතර සිංහල ව්‍යාකරණ පිළිබඳ සමස්ත අවබෝධය පුළුල් කිරීම උදෙසා අපේක්ෂකයා සතතාභ්‍යාසවල යෙදවීමට ද ගුරු භවතුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු යැයි යෝජනා කරමු.

## 2 ප්‍රශ්නය

අපේක්ෂණය : **සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි අන්තර්ගත විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. ඉදිරිපත් කොට ඇති විස්තරය ඇසුරෙන් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ජංගම දුරකථනය මුළු ලෝකය ම සියතට ගත හැකි විස්මය ජනක උපකරණයකි. වර්තමානය වන විට එය බහුකාර්ය උපකරණයක් බවට පත්වී ඇත. මිනිසාගේ යහපතට මෙන් ම අයහපතට ද එය භාවිත කළ හැකි ය. නූතන තරුණ පරම්පරාව සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයට බෙහෙවින් ම ඇබ්බැහි වී ඇත්තේ ද ජංගම දුරකථනය නිසා ය. මේ අතර ජංගම දුරකථනය හා එමගින් භාවිත කළ හැකි සමාජ ජාලා වෙබ් අඩවි අධ්‍යාපනික කාර්යය මෙන් ම සමාජ යහපත ද වෙනුවෙන් භාවිත කළ හැකි අවස්ථා එමට ය. එය තරුණ පරම්පරාවේ අධ්‍යාපනික සංවර්ධනයට මෙන් ම සමාජ ප්‍රගමනයට ද රටේ සංවර්ධනයට ද දායක කර ගත හැකි ය. සමස්ත ප්‍රජාව ම මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇත.

**(ආ)** **ක්‍රීඩාව රටක සෞඛ්‍ය සම්පන්නභාවය පිළිබිඹු කරන දර්ශකයකි. ශ්‍රී ලංකාව ද විවිධ ක්‍රීඩා ඉසවු මගින් ලෝකය තුළ නමක් රඳවාගෙන ඇත. ක්‍රිකට්, මලල හා දැල්පන්දු ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. ක්‍රීඩාව මගින් රටේ තරුණ පරම්පරාවෙහි සෞඛ්‍යය, සමබර පෞරුෂය, නායකත්ව ගුණාංග, ජය පරාජය ඉවසීමේ ගුණය හා සාමූහිකත්වය ආදි යහපත් ගුණාංග රාශියක් වර්ධනය වේ. ක්‍රීඩාවට මුල් තැනක් දී ක්‍රීඩකයන් දිරිගැන්වීම රටක වගකීමක් හා යුතුකමක් වෙයි. නූතන පරම්පරාව ක්‍රීඩාව වෙත නැඹුරු කරවීමට අවශ්‍ය පෙලඹවීම ඇති කිරීමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමත් මගින් ශ්‍රී ලංකාව ලෝකයෙහි දිදුලන නාමයක් බවට පත් කර ගත හැකි ය.**

**(ඉ)** **ශ්‍රී ලංකාව විදේශීය සංචාරකයන්ගේ පාරාදීසයකි. අතීත මිනිසුන් විසින් දායාද කරන ලදුව ප්‍රෞඪ ජාතියක අනන්‍යතාව රැක දෙන විවිධ විස්මිත නිර්මාණ ද ස්වභාව සෞන්දර්යයෙන් අනූන වූ ස්ථාන ද නරඹා සතුටු වීමට සංචාරකයෝ ඉමහත් කැමැත්තක් දක්වති. මෙරටට විශාල විදේශ විනිමයක් උපයා දෙන එම ජාතික උරුමයන් වර්තමානය වන විට විනාශ මුඛයට යමින් පවතින බව බොහෝ දෙනාගේ අදහස යි. මේ උරුමයන්ට හානි පමුණුවන්නේ ද මිනිසා ම ය. එබැවින් අනාගත පරම්පරාව සඳහා ඒවා රැකගැනීමට කටයුතු කිරීම අප කාගෙත් වගකීමක් හා යුතුකමක් ද වේ.**

(ඊ) ස්වාභාවික විපත් සහ ආපදා තත්ත්ව ගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් නිතර අසන්නට ලැබේ. ගංවතුර, නායයෑම් හා නියඟ වැනි තත්ත්ව ඒ අතර ප්‍රධාන වේ. මිනිසාට ජීවය දෙන පරිසරයට මිනිසා විසින් ම කරනු ලබන විවිධ අකටයුතුකම් නිසා ස්වභාව ධර්මය මිනිසාට එරෙහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ස්වාභාවික ව්‍යසන ඇති වේ යැයි සැලකේ. එම නිසා ස්වාභාවික විපත්වලින් ජනතාව මුදවා ගැනීමත් එමගින් විනාශ වන දේපළ හා ජීවිත රැකගැනීමත් සඳහා ක්‍රමෝපාය යෙදීම මිනිසාගේ පරම යුතුකම බව කිව යුතු ය.

(ලකුණු 25 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ) ජංගම දූරකථනය සහ සමාජ ප්‍රගමනය
අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා ජංගම දූරකථන භාවිතය

(ආ) ක්‍රීඩාව මගින් ශ්‍රී ලංකාව ලෝකයේ දිදුලන රටක් බවට පත් කරමු
ශ්‍රී ලංකාව ලෝක පූජිත කිරීම සඳහා ක්‍රීඩාව බල ගන්වමු
ශ්‍රී ලංකා නාමය ලොව දිදුලන්නට ක්‍රීඩා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරමු

(ඉ) ජාතික උරුමයන් සුරකින සංචාරක ව්‍යාපාරයක අවශ්‍යතාව
සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ ජාතික අනන්‍යතාව රැක ගැනීම
ජාතික අනන්‍යතාව නොනසන සංචාරක ව්‍යාපාරයක් ගොඩ නගමු

(ඊ) ස්වාභාවික ආපදා කළමනාකරණය කර ගනිමු

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි

1. සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08යි
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි

01. සාරවත්භාවය - ලකුණු 07යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250ට සමීප ව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

සැලකිය යුතුයි :

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කෙරේ.
02. වැදගත් අදහස් හා සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x ) ලකුණු යොදන්න.
03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර මුළු ලකුණු ලබාගන්න.

නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය : වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02-05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් වෙන් කර ඇත.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 4%ක් ද
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 18%ක් ද
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 56%ක් ද
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 22%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 13ට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයන් ප්‍රමාණය 22%කි. ලකුණු 19-25 අතර ලබා ගත් ප්‍රමාණය 22%කි. සමස්තයක් වශයෙන් ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.







මෙම ප්‍රශ්නයෙහි (අ), (ආ), (ඉ) සහ (ඊ) යටතේ පිළිවෙළින් ''ජංගම දුරකථනය හා සමාජ ප්‍රගමනය'', "ක්‍රීඩාව මගින් ශ්‍රී ලංකාව ලෝකයේ දිදුලන රටක් බවට පත් කරමු.'', "ජාතික උරුමයන් සුරකින සංචාරක ව්‍යාපාරයක අවශ්‍යතාව",''ස්වාභාවික ආපදා කළමනාකරණය කර ගනිමු'' යන මාතෘකා පදනම් කර ගනිමින් මාර්ගෝපදේශිත රචනා සඳහා ව්‍යුහගත ඡේද හතරක් ඉදිරිපත් කර තිබිණි.

ඉහත මාතෘකා අතුරෙන් අනු අංක (අ) "ජංගම දුරකථනය හා සමාජ ප්‍රගමනය" නම් මාර්ගෝපදේශිත රචනය 41%ක් වූ වැඩිම පිරිසක් තෝරා ගෙන තිබිණි. අනු අංක (ඉ) හා (ඊ) තෝරා ගත් පිරිස පිළිවෙළින් 18%ක් හා 35%කි. අඩුම පිරිසක් තෝරා ගෙන ඇත්තේ අනු අංක (ආ) යටතේ ඇති "ක්‍රීඩාව මගින් ශ්‍රී ලංකාව ලෝකයේ දිදුලන රටක් බවට පත් කරමු" යන මාර්ගෝපදේශිත රචනයයි. එය තෝරාගත් පිරිස 6%ක් තරම් පහළ අගයක් ගෙන තිබිණි.

ඒ අතුරෙන් වැඩි ම පහසුතාව වූ 62%ක අගයක් පෙන්නුම් කර ඇත්තේ අනු අංක (ඊ) අක්ෂරය යටතේ ස්වාභාවික ආපදා කළමනාකරණය තේමා කරගත් රචනය වන අතර 43%ක් වූ අඩු ම පහසුතා අගය ලබා ඇත්තේ අනු අංක (ආ) අක්ෂරය යටතේ ක්‍රීඩාව හා සෞඛ්‍ය තේමා කොට ගෙන දෙන ලද රචනයට ය.

මෙම ප්‍රශ්නයේ දී වඩාත් සාර්ථක ව පිළිතුරු සපයා ඇත්තේ ස්වාභාවික ආපදා කළමනාකරණය යන්න තේමා කොටගත් රචනය යි. ඊට හේතුව වන්නේ ජීවිතයට සමීප අද්දැකීමක් ඔස්සේ සැකසුණු තේමාවක් යොදා ගැනීමයි. එහෙයින් අපේක්ෂකයන්ට මාතෘකාවට අනුකූල කරුණු සංවිධානාත්මක ව පෙළ ගස්වමින් සාර්ථක ලෙස රචනයක් ගොඩ නගා ගැනීමට හැකි වී ඇත.

එමෙන් ම 43%ක් වූ අවම පහසුතාව ලබා ගෙන ඇත්තේ ක්‍රීඩාව තේමා කර ගත් මාතෘකාව යි. මීට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ වත්මන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ශිෂ්‍යයා පන්ති කාමරයට සීමා කර තැබීම යි. ශාරීරික හා මානසික සෞඛ්‍යය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ලෝකයට විවෘත වන අධ්‍යාපනික රටාවක් සහිත තේමාවන් ගැන පන්ති කාමරයේ කතා බහට හා විවාදවලට ලක්කරමින් ළමා මනස වියුක්ත චින්තනයට යොමු කිරීමෙන් මනා පරිචයකින් හෙබි විචාරශීලී රචකයකු පන්ති කාමරය තුළින් බිහි කළ හැකි ය.

සමස්තයක් ලෙස ගත් කළ රචනය ප්‍රශ්නයෙහි මධ්‍යයක පහසුතාව 55%ක් වන බැවින් රචනා ලිවීමේ හැකියාව තව දුරටත් වර්ධනය කළ යුතු ය. රචනා ලිවීමේ දී නිවැරදි ව්‍යාකරණය, අක්ෂර වින්‍යාසය, පද බෙදීම ආදි ශිල්පීය ප්‍රයෝග නිවැරදි ව භාවිත කිරීමට යොමු කළ යුතු ව ඇත. නිර්මාණාත්මක රචනා තුළ භාෂාමය කුසලතා ප්‍රදර්ශනය විය යුතු බැවින් ශිෂ්‍යයන් මෙතෙක් ඉගෙන ගෙන ඇති යුගල පද, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, ඉඟි වැකි ආදිය උචිත පරිදි භාවිත කරමින් රචනා ලිවීමට හුරු කළ යුතු ය. සංවිධානාත්මක ව රචනා ලිවීම සඳහා සැකිල්ලකට අනුව ලිවීමේ හුරුව ලබා දීම අවශ්‍ය ය.

විෂය නිර්දේශයෙහි ඇතුළත් තේමා පාදක කර ගනිමින් සකසා ගත් මාතෘකා යටතේ රචනා ලිවීම සඳහා සුදුසු ව්‍යුහගත රචනා ශිෂ්‍යයන්ට සැපයිය යුතු ය. රචනා ලිවීම සඳහා තොරතුරු සපයා ගැනීමට සුදුසු සම්පත් ශිෂ්‍යයන්ට හඳුන්වා දීම අවශ්‍ය ය. පොත්පත්, සඟරා, පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනී, ප්‍රවෘත්ති, සාකච්ඡා මෙන් ම අන්තර්ජාලය මගින් ද තොරතුරු ගවේෂණයට මග පෙන්වීම අවශ්‍ය ය. ස්වකීය ලේඛන ශෛලියක් ගොඩ නගා ගැනීම සඳහා පොතපත කියවීමේ පරිචයක් ඇතිකර ගත යුතු බව ශිෂ්‍යයන්ට පෙන්වා දීම සුදුසු ය.

දී ඇති රචනා ව්‍යුහ අතුරෙන් අපේක්ෂකයන්ට මග පෙන්වීමක් වශයෙන් (ඉ) මාතෘකාව යටතේ රචනා ආදර්ශයක් පහත දක්වා ඇත.

2. (ඉ) **ස්වාභාවික ආපදා කළමනාකරණය කර ගනිමු.**

පෘථිවියේ සිදුවන ස්වාභාවික ක්‍රියාවලියක් ක්‍රමයෙන් වර්ධනය වී විනාශකාරී ප්‍රතිඵල අත්කර දෙනු ලබන්නේ නම් එය ස්වාභාවික ආපදාවක් ලෙස හඳුන්වා දිය හැකි ය. සුනාමි, ගංවතුර, නායයෑම්, ලැව්ගිනි, භූමිකම්පා. අකුණුසැර හා සුළිසුළං වැනි තත්ත්ව ස්වාභාවික ආපදාවලට නිදසුන් ලෙස ඉදිරිපත් කිරීමට හැකි ය. රටක තිරසර සංවර්ධනයට ඉමහත් බාධාවක් වන මෙවැනි ආපදා නිසා ලොව බොහෝ රටවල ජනතාව මහත් සේ පීඩා විඳිති. වර්තමානයේ දී ස්වාභාවික විපත් සහ ආපදා තත්ත්ව පිළිබඳ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් අසන්නට ලැබෙයි. ගංවතුර, නායයෑම් හා නියඟ වැනි තත්ත්ව ඒ අතර ප්‍රධාන ය.

තෙත් කලාපයට අයත් රත්නපුර, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්කවලට ගංවතුර ද වියළි කලාපීය ප්‍රදේශ වන අම්පාර, අනුරාධපුර හා වවුනියා වැනි දිස්ත්‍රික්කවලට 'නියඟ' ද මධ්‍ය කඳුකරයට අයත් ප්‍රදේශ වන නුවරඑළිය, මහනුවර හා බදුල්ල වැනි දිස්ත්‍රික්කවලට 'නායයෑම්' වැනි ස්වාභාවික ආපදා තත්ත්ව ද ගැන කලින් කල අසන්නට ලැබේ. රටේ කුමන ස්ථානයක ස්වාභාවික ආපදාවක් සිදු වුවත් ඉන් පීඩාවට පත් වන්නේ රටේ ජනතාව ය.

මිනිසාට ජීවය දෙන පරිසරයට මිනිසා විසින් ම ආත්මාර්ථකාමිත්වය පෙරටු කොට කරනු ලබන අදූරදර්ශී අමනෝඥ ක්‍රියාකලාප නිසා ස්වභාවධර්මය මිනිසාට එරෙහි ව නැඟී සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් යථෝක්ත ව්‍යසන ඇති වන බව කීම යුක්ති සහගත ය. ස්වභාවධර්මයට මිනිසා සෙනෙහස දක්වන්නේ නම් ස්වභාවධර්මය ද පෙරළා මිනිසාට සෙනෙහස දැක්වීමට දෙවරක් නොසිතනු ඇත.

"වත් කළ දිය නෙරළු තුරු මුලට පියකරු
දෙන් මුදුනින් පලරස රැගෙන අමයුරු"

සුභාෂිත කර්තෘ අලගියවන්න මුකවෙටි පඬිතුමා මින් ප්‍රකාශ කරන්නේ එම උතුම් ළබැඳියාව ම නොවේ ද?

මිනිසා ස්වභාවධර්මයට කරනු ලබන අරියාදුව (විනාශය) නතර කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාව වඩාත් ඉස්මතු වන්නේ මතු සඳහන් කළ විපත් මගින් සිදුවන දේපළ හා ජීවිත විනාශය තක්සේරු කිරීමට පවා අසීරු නිසා ය. අතලොස්සක් මිනිසුන් පරිසරයට කරන මහත් ව්‍යසන තුරන් කරවීම සඳහා දැඩි නීතිරීති පද්ධතියක් රටේ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැන නැඟේ. එමගින් ස්වාභාවික විපත් යම් ප්‍රමාණයකට අවම කර ගැනීමට අවශ්‍ය පසුබිම සකසා ගත හැකි ය. එමෙන් ම පරිසරය සුරකීමේ යහපත් ආකල්ප කුඩා අවදියේ සිට ම ප්‍රගුණ කිරීමට උත්සුක වීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. පරිසරය සුරකීමේ ක්‍රියාවලියේ දී ලොව බොහෝ දියුණු රටවල් ගෙන ඇති ක්‍රියා මාර්ග අධ්‍යයනය කිරීම මෙන් ම පැරන්නන් පරිසරය ආරක්ෂා කිරීම සඳහා යොදා ගෙන තිබූ පැරණි තාක්ෂණ ක්‍රමවේ ද යළි භාවිතයට පියවර ගැනීම මගින් ද උචිත උපාය මාර්ග සොයා ගත හැකි ය.

## 3 ප්‍රශ්නය

අපේක්ෂණය :

කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින් එහි හරය වටහා ගෙන ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

අපේක්ෂකයන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. මේ සඳහා අපේක්ෂිත සාරාංශය පිළිබඳ පැහැදිලි අදහසක් ලබා දී තිබේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

"වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවලට කිසිම නෑ සබඳකමක් නැති අපූරුවක් නොව ක්‍රමයෙන් වෙනස් වීමෙන් අලුත් ස්වරූපයක් ගත් පැරණි කෙටිකතාවමයි." යනු මාර්ටින් වික්‍රමසිංහගේ කියුමකි. ඔහු මේ මතය පවසන්නේ වර්තමාන සිංහල කෙටිකතාව අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, සිංහල ජාතක පොත යනාදි අපේ චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හා සම්බන්ධ කරමිනි. වික්‍රමසිංහ විශේෂයෙන් ම සිංහල ජාතක කථාත් වර්තමාන කෙටිකතාත් අතර බොහෝ සමාන ලක්ෂණ දකින්නේ වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලිනි. වර්තමාන කෙටිකතා ජාතක කථාවලින් වෙනස් වන්නේ වස්තු විකාසනය අතින් බව ඔහු පෙන්වා දී ඇත්තේ ය.

චිරන්තන සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තාගේ කථා ආදි ජන කතාන්තර, කවි කොළ යනාදි වශයෙන් කථා ප්‍රවෘත්ති කියැවෙන ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග රාශියක් අපට ඇත.

ප්‍රමාණය අනුව සලකන කල කෙටි වූ කතාවේ ඉතිහාසය බොහෝ ඈතට දිවෙන නමුත් නවකථාව, කෙටිකතාව යන නම් ඇති ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත නව සාහිත්‍යාංග දෙක සිංහලයට පුරුදු වූයේ බටහිර සාහිත්‍යයේ ආභාසය ඇති ව බව කිව මනා ය. මෙරට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු සාහිත්‍යය මෙහි පැතිරී යාමත් සමග ම ඒ සාහිත්‍යය ආදර්ශයට ගෙන ඉන් ආභාසය ලබමින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමට ගත් එක් උත්සාහයක එක් ප්‍රතිඵලයකි, මෙරට වර්තමාන කෙටිකතාව ආරම්භ වීම. එසේ ම සිංහල පුවත්පත් සඟරා ද කෙටිකතාවේ දියුණුවට මහත් රුකුලක් වූයේ ය.

(ලකුණු 10 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

- සාරාංශකරණය

  අන්තර්ගතය

  (i) වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවල විකාසනයක් බව මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස යි.

  (ii) වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලින් ජාතක කථා හා කෙටිකතා අතර සම්බන්ධතාවක් තිබුණත් වස්තු විකාසනය අතින් වෙනස් ය.

  (iii) මේ හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තාගේ කථා ආදි ජනකතා හා කවි කොළ ඇතුළත් ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග පවතී.

  (iv) නවකතාව, කෙටිකතාව යන ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත සාහිත්‍යාංග සිංහලයාට හුරු වූයේ ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් පසු බටහිර පොත් කියවීමෙන් ලද ආභාසයෙනි.

  (v) කෙටිකතාවේ දියුණුවට පුවත්පත්, සඟරා ඉවහල් විය.

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10යි.
අන්තර්ගතය - ලකුණු 06යි.
වචන ගණන - ලකුණු 02යි.
ශිල්පීය දක්ෂතා - ලකුණු 02යි.

අපේක්ෂිත ප්‍රධාන අදහස් :

- වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.
- වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.
- ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.
- එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත් නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණ 02කි.
- වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.
- දුර්වල සාරාංශ සඳහා බිංදුව නොදී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

### 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 2%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 45%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද

ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ වැඩි ප්‍රමාණයක් හිමි කර ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 81%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 19%ක් පමණි.




මෙම ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 66%කි. පිළිතුරු සැපයීම ප්‍රශස්ත මට්ටමට ළඟා වී නොමැත. සාරාංශකරණයේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේද අනුගමනය කිරීමට අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. දී ඇති උද්ධෘතය කියවා වැදගත් කරුණු ග්‍රහණය කර ගැනීමේ හැකියාව මඳ බව පැහැදිලි ය. සාරාංශකරණයේ දී දිගු වැකි ලිවීම, විරාම ලක්ෂණ අවිධිමත් ව යෙදීම හා පද බෙදීමේ දුර්වලතා දක්නට ලැබුණි. සන්ධි හා සමාස යන ව්‍යාකරණාංග ප්‍රායෝගික ව භාවිත කිරීමේ හැකියාව මඳ බව පැහැදිලි ව දැකිය හැකි විය. සාරාංශ ලිවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කිරීම අවශ්‍ය වේ. සාරාංශකරණය සඳහා සුදුසු උද්ධෘත හඳුනා ගෙන ඒවා සාරාංශකරණය කිරීමේ සතතාභ්‍යාසයෙහි යෙදීමට සිසුන්ව උනන්දු කළ යුතු අතර එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ යුතු ය.

* ප්‍රධාන අදහස තමාට ග්‍රහණය වන තුරු ඡේදය කීප වතාවක් කියවීම
* ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු වන සේ සලකුණු යොදා ගැනීම
* ප්‍රධාන අදහස් පහක්වත් සාරාංශයෙහි අන්තර්ගත කිරීම
* ප්‍රධාන අදහස් කෙටි වැකිවලින් ලිවීමට හුරු කිරීම
* දී ඇති ඡේදයේ වචන සංඛ්‍යාවෙන් 1/3 වන සේ සාරාංශය ගොනු කිරීම
* වියරණ දෝෂවලින් තොර ව වැකි ලිවීමට හුරු කිරීම
* අත් අකුරු, විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වීම
* වර්ණනා, අර්ථකථන, ප්‍රකාශන, උපුටා ගැනීම්, උපමා ආදිය ඉවත් කිරීම
* හැකි සෑම අවස්ථාවක ම වචන සන්ධි කිරීම හා සමාස කිරීම
* සාරාංශය ලිවීමේ දී හැකිතාක් තමන්ගේ ම වචන භාවිත කිරීම
* ප්‍රශ්නය ඡේද කිහිපයකින් දී ඇතත් පිළිතුර එක් ඡේදයක් ලෙස ගොඩ නැගීම

**අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආකෘතියක් පහත දැක්වේ.**

නිවැරදි සාරාංශය

මාර්ටින් වික්‍රමසිංහගේ අදහසට අනුව වත්මන් කෙටි කතාව පැරණි කෙටිකතාවල ම විකාසනයකි. වස්තු විෂයෙන් හා යථාර්ථ රීතියෙන් ජාතක කතා හා කෙටිකතා අතර සබැඳියාවක් තිබුණ ද වස්තු විකාසනයෙන් වෙනස් වේ. මීට අමතර ව ජන කතා හා කවිකොළ සහිත ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග අප සතු ය. නවකතාව, කෙටිකතාව යන්නට සුවිශේෂිත ලක්ෂණ සහිත සාහිත්‍යාංග සිංහලයට ලැබෙනුයේ ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් පසු බටහිර පොත්පත් කියවීමෙන් ලද අභ්‍යාසයෙන් ය. තව ද සිංහල පුවත්පත් හා සඟරා ද කෙටිකතාවේ දියුණුවට ඉවහල් විය. වචන 71කි.

## 04 ප්‍රශ්නය

අපේක්ෂණය : අපේක්ෂකයන්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ඇසුරෙන් ප්‍රශ්න 5ක් ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කර ගෙන නිශ්චිත ව නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පූර්ව බෞද්ධ යුගයේ සමාජ ජීවිත තත්ත්වය පිළිබඳ වටිනා තොරතුරු රැසක් 'ජාතක කථා' මගින් අනාවරණය වන්නේ ය. ඒ සමාජයෙහි අධ්‍යාපනයට ලැබුණේ විශිෂ්ට තැනකි. මේ කථාවලට අනුව ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය අත් වූයේ බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට සහ ධනවත් ව්‍යාපාරිකයනට පමණි. ඒ සමාජයේ හැම විට ම පාහේ ගුරුකමෙහි නියුක්ත වූයේ බ්‍රාහ්මණ වංශිකයෙකි. හෙතෙම දිසාපාමොක් ඇදුරු –දිසාවේ ප්‍රධාන ආචාර්යවරයා– යනුවෙන් හැඳින්විණි. විශාල ප්‍රදේශයක ඉගැන්වීමේ කටයුතුවල භාරය පැවරුණේ එබඳු ආචාර්යවරයකුට ය.

දිසාපාමොක් ආචාරීන් කෙරෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි දේශපාලන විද්‍යාව සහ යුද්ධ පුහුණුවක් ද ඇතුළත් විය. මේ ඉගෙනීම වයස දහසය වන විට නිමාවට පත් කළ බව පෙනේ. තරුණයන් විවාහ ජීවිතයට ඇතුළු වීමත් පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීමත් සොළොස් වියෙහි දී සිදු වීම සාමාන්‍ය සිරිත විය.

සෑම පුරාතන සංස්කෘතියකට ම පොදු වූ අයුරින් භාරතීය සංස්කෘතියේ සියලු අධ්‍යාපන සහ අධ්‍යයන විධි වාචික මාධ්‍යය උපයෝගි කොට ගති. එවක ලිවීමේ කලාව ගැන දැනීම නුවූ බව මින් අදහස් නො කැරෙයි. ලියුම් සහ වෙනත් ලේඛන ගැන සඳහන් නොයෙක් තැන් වෙයි. වේදේහ රජුගේ බිසව වූ උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වෙයි. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග ඒ කථාවෙහි ම පැවසෙයි.

තව ද ශිෂ්‍යයන් යම් කරුණක් පොතපත කියවීමෙන් දැනගත් බව කිව හැකි නො වේ. කියවීම සඳහා පිළියෙල වූ පොතපතක් නො වූ බැවිනි. ගුරුවරයා කට වචනයෙන් ඉදිරිපත් කළ සූත්‍රයන් ඉගෙන ගෙන ධාරණය කරනු වස් නොයෙක් විට පුනරුච්චාරණය කිරීම ශිෂ්‍යයා විසින් කරනු ලැබිය යුතු ය. උගත් මිනිසා හැඳින්වූයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති යන අරුත දෙන බහුශ්‍රැත යන සකු වදනෙනි.

(i) ජාතක කථාවලින් හෙළිවන පරිදි ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය උදාවූයේ කවුරුන්ට ද?

(ii) දිසාපාමොක් ආචාරීන්ගෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි ඇතුළත් අංග කවරේ ද?

(iii) ජීවිතයේ සොළොස්වන විය වැදගත් කොට සලකනු ලැබීමට හේතු වූ කරුණු මොනවා ද?

(iv) පුරාතන භාරතීය සංස්කෘතියේ ලිවීමේ කලාව පැවති බව තහවුරු කිරීමට දක්වා ඇති සාධක කවරේ ද?

(v) පොතපත කියවීමෙන් නොව කට වචනය හා ධාරණය මුල් කොට ගෙන පැරණි ශිෂ්‍යයන් ශාස්ත්‍ර උගත් බව සනාථ කිරීමට මෙම ලේඛකයා යෙදූ සාධක **දෙක** මොනවා ද?

(ලකුණු 01යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට, ධනවත් ව්‍යාපාරිකයනට
**(කරුණු 03 ම ලියා ඇත්නම් ලකුණු 02 යි. කරුණු 02ක් ලියා ඇත්නම් ලකුණු 01 යි. එක කරුණක් ලියා ඇත්නම් ලකුණු නැත.)**

(ii) දේශපාලන විද්‍යාව, යුද්ධ පුහුණුව

(එක් කරුණකට ලකුණු 01යි)

(iii) i. තරුණයන් විවාහ දිවියට ඇතුළු වීම
ii. පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීම

(ලකුණු 02යි)

(iv) i. උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වීම
ii. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග උම්මග්ග ජාතකයෙහි සඳහන් වීම

(ලකුණු 02යි)

(v) පුනරුච්චාරණය කිරීම
උගත් මිනිසා 'බහුශ්‍රැත' යන නමින් හැඳින්වීම

(ලකුණු 02යි)

(කරුණු 2 ක් ඇත්නම් ලකුණු 02 යි. එක් කරුණක් සඳහා ලකුණු 01යි)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ප්‍රශ්න අංක 4 තෝරා ගෙන ඇති පිරිස 94%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 2%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 6%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 70%ක් ද

ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත් පිරිස 92%ක් වන අතර, 8%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට අඩුවෙනි. මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම ඉහළ මට්ටමක පැවතිණි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (i) කොටස සඳහා ය. එහි පහසුතාව 98%කි. (ii), (iii), (iv), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 93%, 90%, 67% සහ 58% කි. ප්‍රශ්නයේ අනෙක් කොටස්වලට සාපේක්ෂ ව (v) කොටසට පිළිතුරු සැපයීම සාර්ථක වී නොමැත. එහි පහසුතාව අඩු මට්ටමක පවතී. (i), (ii), (iii) කොටස්වල පහසුතාව ප්‍රශස්ත මට්ටමක පවතින අතර, (iv), (v) කොටස්වලින් මධ්‍යස්ථ පහසුතාවක් ප්‍රදර්ශනය කෙරෙයි.

අපේක්ෂකයන්ගේ අවබෝධ හැකියාව මැනෙන මෙම ප්‍රශ්නයට අවධානයෙන් යුතු ව පිළිතුරු සැපයීමෙන් නියමිත ලකුණු සංඛ්‍යාව ලබා ගැනීම පහසු වේ. අනිවාර්ය ප්‍රශ්නයක් වන බැවින් මේ පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ වැඩි අවධානය යොමු කිරීම අවශ්‍ය ය. එහි දී විවිධ ඡේද යොදා ගැනීමත් එහි ඇති සෑම වචනයක් කෙරෙහි ම දැඩි අවධානයක් යොමු කරවමින් ශිෂ්‍යයන් අභ්‍යාසකරණයේ යෙදවීමත් ගුරු කාර්යභාරයකි. පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්නය නිවැරදි ව අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳ ව ශිෂ්‍යයන් දැනුවත් කළ යුතු ය. ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අංග සම්පූර්ණ පිළිතුරක් සැපයීමට ශිෂ්‍යයන්ට උපදෙස් ලබා දිය යුතු අතර අඩුපාඩු සහිත පිළිතුරුවලට ලකුණු හිමි නොවන බවත් අවධාරණය කළ යුතු ය.

මෙම ප්‍රශ්නයට හිමි උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට ශිෂ්‍යයන් හුරු කළ යුතු ය. ජාතක කතාවලින් හෙළි වන පරිදි ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍ය උදා වූයේ කවුරුන්ට ද? යනුවෙන් විමසා ඇති (1) ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලෙස බ්‍රාහ්මණයනට,රාජවංශිකයනට,ධනවත් ව්‍යාපාරිකයනට යන කරුණු තුන ම ලියා ඇත්නම් ලකුණු 2ක් හිමි වූ අතර කරුණු 2ක් පමණක් ලියූ විට හිමි වුයේ ලකුණු 01කි. එක් කරුණක් පමණක් ලියා ඇති විට ලකුණු හිමි වුයේ නැත.

(iv) පුරාතන භාරතීය සංස්කෘතියේ ලිවීමේ කලාව පැවති බව තහවුරු කිරීමට දක්වා ඇති සාධක කවරේ ද? යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්නයට අදාළ ව ඉදිරිපත් කර ඇති සාධක සියල්ල ම ලියූ විට පමණක් සම්පූර්ණ ලකුණු හිමි වූ අතර එක් සාධකයක් පමණක් ලිවීමෙන් ලබා ගත හැකි වූයේ අදාළ ලකුණෙන් භාගයකි.

ඒ නිසා අවබෝධය මැනෙන මෙම ප්‍රශ්නයේ කොටස් පහට පිළිතුරු ගොනු කිරීමේ දී ඡේදය තුළ ම පිළිතුරු සොයා ගත හැකි බවත්, පහසුවෙන් ම ලබා ගත හැකි ලකුණු 10ක් මෙම ප්‍රශ්නයට හිමිවන බවත් එබැවින් අවබෝධයෙන් යුතු ව කියවා නිවැරදි පිළිතුරු ග්‍රහණය කර ගෙන පිළිතුරු ලිවීම අවශ්‍ය බවත් ශිෂ්‍යයන්ට පැහැදිලි කර දිය යුතු ය. මේ සඳහා ශිෂ්‍යයන් සතතාභ්‍යාසයෙහි යෙදවීම ගුරුවරයා සතු වගකීමකි.

මේ තත්ත්වය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ඡේද ආශ්‍රිත ව නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ අභ්‍යාස කරවීම; බාහිර පොත් පත්, සඟරා, පුවත්පත් ආදිය කියවීමට සිසුන් උනන්දු කරවීම, දුරවබෝධ වචනවලට අර්ථ සැපයීමට ශබ්ද කෝෂ භාවිතයට සිසුන් යොමු කරවීම ගුරුභවතුන්ගේ කාර්යය විය යුතු ය.

දෙන ලද පාඨය කියවා අසන ලද ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු තෝරා ගැනීමේ හැකියාව ඇතැම් අපේක්ෂකයන්ට නොතිබුණු බව පැහැදිලි වන බැවින් අදාළ පිළිතුරු ඍජු ව තෝරා ගෙන නිශ්චිත ව ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් යොමු කළ යුතු ව ඇත.

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳ ව විමසා තිබූ ප්‍රශ්න පහෙන් තුනක් පහසුතාව 90% ඉක්මවා තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 81%ක පමණ ඉහළ අගයක් ගන්නා අතර II පත්‍රයෙහි ප්‍රශ්න පහ අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය බවට මෙම ප්‍රශ්නය පත් ව ඇත. මෙම තත්ත්වය තවදුරටත් ඉහළ නැංවීමට පහත සඳහන් ක්‍රියාමාර්ග පන්ති කාමර අභ්‍යාසකරණයේ දී අනුගමනය කළ හැකි වේ.

අවබෝධය ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

1. දී ඇති ඡේදය කීපවරක් අවබෝධයෙන් යුතු ව කියවීමට හුරුවීම
2. දුරවබෝධ වචනවල අර්ථය සමස්ත ඡේදය තුළින් ම තේරුම් ගැනීම
3. අසා ඇති ප්‍රශ්න අවබෝධයෙන් යුතු ව කියවා ඡේදයේ නිවැරදි පිළිතුරු ඇති ස්ථානයේ සලකුණු කර ගැනීම
4. අදාළ නිවැරදි පිළිතුරු සංක්ෂිප්ත ව දැක්වීම

5 ප්‍රශ්නය

අපේක්ෂණය : ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම.

**5.** පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන **අත් පත්‍රිකාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

ජයනි කරුණාතිලක වන ඔබ අනුරාධපුර මහ වීදියේ, අංක 42 දරන ස්ථානයේ 'සයුර' නමින් පොත්හලක් විවෘත කිරීමට සැලසුම් කරමින් සිටින්නෙහි ය. එය දිනපතා පෙ. ව. 8.00 සිට ප. ව. 7.00 තෙක් විවෘත ව තිබෙන අතර පෝය දිනවල දී වසා තැබේ. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාසල් උපකරණ ද මිලට ගැනීමේ අවස්ථාව මෙමගින් උදා කෙරෙයි. ජනවාරි මාසය තුළ මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10%ක වට්ටමක් ද ලබා දීමට අපේක්ෂා කෙරේ.

**නැතහොත්**

පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පතක පළකිරීම සඳහා යෝග්‍ය **වාර්තාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

තුරුසරුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද කලා උළෙළට සහභාගි වූ පුවත්පත් වාර්තාකරුවකුගේ සටහනක් පහත දැක්වේ.

| | |
|---|---|
| දිනය | : 2018.11.30 |
| වේලාව | : ප. ව. 2.00 |
| ස්ථානය | : ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය, තුරුසරුගම |
| ප්‍රධාන ආරාධිතයා | : ප්‍රවීණ කලාකරු සමරනාථ එදිරිසූරිය |
| විශේෂ දේශනය | : මහාචාර්ය සුසිල් රාජකරුණා |
| මාතෘකාව | : සාහිත්‍යයේ නව ගමන්මග |

තිළිණ හා සහතිකපත් ජයග්‍රාහකයන් වෙත පිරිනැමීම මෙදින සිදු විය. ප්‍රදේශයේ සාහිත්‍යකරුවන් තිදෙනකුට ද 'සාහිත්‍යදීපනී' සම්මානය පිරිනැමිණි. නැටුම් ගැයුම් ආදි විචිත්‍රාංග රාශියක් ද තිබිණ. පුවත්පත් වාර්තාකරු ඔබ යැයි සිතන්න. (ලකුණු 15 යි)

(ලකුණු 15යි.)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

අත් පත්‍රිකාව

| | | | |
|---|---|---|---|
| 1. | ආකෘතිය | - | ලකුණු 05යි |
| 2. | අන්තර්ගතය | - | ලකුණු 07යි |
| 3. | ශිල්පීය දක්ෂතා | - | ලකුණු 03යි |
| | | | මුළු ලකුණු ලකුණු 15යි |

1. **ආකෘතිය** - ලකුණු 05යි.
   1. ශීර්ෂ පාඨය / මාතෘකාව - ලකුණු 01යි.
   2. පළ කරන්නාගේ නම, තනතුර - ලකුණු 01යි.
   3. පළ කරන දිනය - ලකුණු 01යි.
   4. නිර්මාණාත්මක බව - ලකුණු 02යි.

2. **අන්තර්ගතය** - ලකුණු 07යි.
   i. 'සයුර' නමින් පොත්හලක් විවෘත වන බව
   ii. අංක 42, මහවීදිය, අනුරාධපුර ලිපිනයෙහි පිහිටා ඇති බව
   iii. දිනපතා විවෘත ව තැබෙන බව
   iv. විවෘත ව තැබෙන වේලාව පෙ.ව. 8.00 - ප.ව. 7.00 තෙක් බව
   v. පෝය දිනවල වසා තැබෙන බව
   vi. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාඨශාලා උපකරණ මිලට ගැනීමේ අවස්ථාව හිමි වන බව
   vii. ජනවාරි මාසයෙහි මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10%ක වට්ටමක් හිමි වන බව

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

   නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

* නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය **ලකුණු 03කි**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

නැතහොත්

ප්‍රවෘත්ති පත්‍ර වාර්තාව

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15යි.

1. ආකෘතිය - ලකුණු 03යි.
2. අන්තර්ගතය - ලකුණු 09යි.
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි.

1. ආකෘතිය - ලකුණු 03යි.
   1. මාතෘකාව - ලකුණු 01යි.
   2. වාර්තා කරන්නේ කවුරුන් ද යන වග - ලකුණු 01යි.
   3. යෝග්‍ය ලෙස සිද්ධි ගළපා තිබීම - ලකුණු 01යි.

2. අන්තර්ගතය - ලකුණු 09යි.

1. කලා උලෙළෙහි සංවිධායකයන් සම්බන්ධ ව
2. දිනය හා වේලාව
3. ස්ථානය
4. ප්‍රධාන ආරාධිතයා
5. විශේෂ දේශනය
6. දේශන මාතෘකාව
7. ජයග්‍රාහකයන් වෙත තිලිණ හා සහතිකපත් පිරිනැමීම
8. 'සාහිත්‍යදීපනී' සම්මානය
9. නැටුම්, ගැයුම් ආදි විචිත්‍රාංග

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

* නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

* නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




5 ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 91%කි. ලකුණු 15ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 3%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 12%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 43%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 42%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය යටතේ ප්‍රශ්න දෙකක් ඇතුළත් ය. අපේක්ෂකයාට පහසු ප්‍රශ්නය තෝරා ගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව ලබා දී ඇත.







පස්වන ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 69%ක ප්‍රතිශතයක් අත් පත්‍රිකාව පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන තිබුණ ද පුවත්පත් වාර්තාව තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 31%ක් පමණි. ඒ අනුව අත් පත්‍රිකාව සඳහා පිළිතුරු සැපයීමට වැඩි පිරිසක් යොමු වූ බව පැහැදිලි වේ.

පස්වන ප්‍රශ්නයේ අත් පත්‍රිකාව සඳහා අපේක්ෂකයන්ගේ පහසුතාව 68%ක් ද පුවත්පත් වාර්තාව සඳහා පහසුතාව 72%ක් ද වේ. මේ අනුව මෙම ප්‍රශ්නයේ පුවත්පත් වාර්තාවට සාර්ථක ව පිළිතුරු සපයා ඇති බව ගම්‍ය වේ.

**අත් පත්‍රිකාව**

ප්‍රායෝගික ලේඛනයට අදාළ ව නිර්මාණය කරන ලද අත්පත්‍රිකාව සඳහා හිමි ලකුණු සංඛ්‍යාව 15කි. විභාග අපේක්ෂකයන්ගේ පිළිතුරු පත් ඇසුරෙන් ලබා ගත් දත්තවලට අනුව පහත සඳහන් තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. මෙම ප්‍රශ්නයේ පහසුතාව 68%කි. මෙමගින් අනාවරණය වන්නේ විභාග අපේක්ෂකයන් ප්‍රශස්ත මට්ටමින් පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව යි.

අත් පත්‍රිකාවේ ලකුණු හිමි කරගන්නා ආකාරය පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කිරීම මගින් ලකුණු ප්‍රශස්ත මට්ටමකට ළඟා කර ගැනීමේ හැකියාව ඇත. අත් පත්‍රිකා නිර්මාණය කිරීම පිළිබඳ සජීව අත් දැකීම් පන්ති කාමරය තුළ දී ලබා දීමට ක්‍රියා කළ යුතු ය. විවිධාකාරයේ අත් පත්‍රිකා බෙදා දී එම අත් පත්‍රිකාවල ප්‍රබලතා මෙන් ම දුබලතා ද හඳුනා ගැනීමට සලස්වා ප්‍රශස්ත මට්ටමේ අත් පත්‍රිකාවක් සකස් කිරීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කළ යුතු ය.

එම සාකච්ඡාවේ දී අත් පත්‍රිකාව මගින් සන්නිවේදනය කිරීමට අපේක්ෂිත තොරතුරු නිරවුල් ව පැහැදිලි ව සංක්ෂිප්ත ව ඉදිරිපත් කළ යුතු බවත් නිර්මාණශීලී අත් පත්‍රිකාවක් සකස් කිරීම සඳහා භාවිත කළ හැකි උපක්‍රම මොනවා ද යන්න පිළිබඳ ව අවධානය යොමු විය යුතු බවත් පෙන්වා දිය යුතු ය. වර්ණ භාවිතය, අක්ෂරවල ප්‍රමාණය හැඩය මෙන් ම අත් පත්‍රිකාවේ ආකෘතිය කෙරෙහි ද අවධානය යොමු කළ යුතු බව ද පෙන්වා දිය යුතු ය. පැහැදිලි හා පිරිසිදු ලෙස අත් පත්‍රිකාව සැකසීමට හුරු කළ යුතු අතර ව්‍යාකරණානුකූල ව හා ශිල්පීය ප්‍රයෝග අනුගමනය කරමින් එය නිර්මාණය කිරීමට යොමු කිරීම අවශ්‍ය වේ. සැම විට ම නියමිත වචන සීමාව තුළ රැඳෙමින් ප්‍රායෝගික ලේඛන සකස් කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කළ යුතු ය.

ආදර්ශ අත් පත්‍රිකාව

5 I කියවමු - ලොව දිනමු

අනුරාධපුර මහ වීදියේ අංක 42 දරන ස්ථානයේ

" සයුර "

5 වසර ශිෂ්‍යත්වය සඳහා අත්‍යවශ්‍ය ම පොත් පත් හා ප්‍රශ්නෝත්තර

පොත්හල ඔබ වෙනුවෙන් ම 2018.12.24 දින පෙ.ව. 7.35ට එළඹෙන සුබ මොහොතින් විවෘත වන වගයි. දිනපතා පෙ.ව. 8.00 සිට ප.ව. 7.00 දක්වා විවෘතයි. පෝය දිනවල වසා ඇත. ඔබට අවශ්‍ය විවිධ විෂයයන්ට අයත් පොත් පත්

ජනවාරි මස 10%ක වට්ටමක්

* ප්‍රාථමික
* සාමාන්‍ය පෙළ
* උසස් පෙළ

} අදාළ සියලු ම පොත්පත්

| | |
|---|---|
| නවකතා | සිංහල |
| කෙටිකතා | ප්‍රංශ |
| පරිවර්තන | ජපන් |
| නාට්‍ය | ජර්මන් |
| ඉංග්‍රීසි | කොරියන් ආදි පොත් හා |
| | සියලු ම වර්ගයේ සඟරා ... |

එන්න - කියවන්න. දිනන්න - ලෝකය

ජයනි කරුණාතිලක,
"සයුර" පොත්හල,
42 මහවීදිය,
අනුරාධපුර.
2018.11.30

**පුවත්පත් වාර්තාව**

පුවත්පත් වාර්තාව පස්වන ප්‍රශ්නයේ විකල්ප ප්‍රශ්නය යි. මෙම ප්‍රශ්නයෙන් විභාග අපේක්ෂකයාට පුවත් පත් වාර්තාවක් පිළියෙල කිරීමට අවස්ථාව ලබා දී ඇත. මෙය ශිෂ්‍යයන්ගේ ලේඛන හැකියාව තවදුරටත් වර්ධනය කළ හැකි ප්‍රායෝගික ලේඛන වර්ගයකි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාව 72%කි.

ශිෂ්‍යයන්ගේ ලේඛන කුසලතා වර්ධනය කිරීම සඳහා පන්ති කාමර ක්‍රියාකාරකම් මෙන් ම විෂය සමගාමී ක්‍රියාකාරකම් ද යොදා ගත හැකි ය. පාසලේ ක්‍රියාත්මක බිත්ති පුවත් පත සඳහා වාර්තා සැපයීම පුවත්පත් වාර්තා ලිවීම සඳහා හුරුවක් ලබා ගැනීමට යොදා ගත හැකි ය. පුවත් පත් වාර්තා ලිවීම සඳහා තමාට ආවේණික රචනා ශෛලියක් ගොඩ නගා ගත යුතු බව පෙන්වීමත්, ඒ සඳහා ජාතික පුවත්පත්වල සේවය කරන ප්‍රවීණ මාධ්‍යවේදීන්ගේ විවිධ වර්ගයේ වාර්තා පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කිරීමත් වැදගත් වනු ඇත.

පුවත් පත් වාර්තා ලිවීමේ දී මාතෘකාව මෙන් ම අන්තර්ගතය ද පාඨකයා ඇඳ බැඳ තබා ගැනීමට සුදුසු ලෙස සකස් විය යුතු බව අවධාරණය කිරීම සුදුසු ය.

ඒ සඳහා ආකර්ෂණීය ලෙස භාෂාව හැසිරවීමේ පරිචයක් ඇති කර ගත යුතු බව ද අවධාරණය කරන්න. තම ලේඛන කලාව වර්ධනය කර ගැනීම සඳහා පරිශීලනය කළ යුතු පොතපත ශිෂ්‍යයන්ට හඳුන්වා දෙන්න. ඉහත කරුණු කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කර සතතාභ්‍යාසයේ යෙදෙමින් ස්වීය ලේඛන කලාවක් ගොඩ නගා ගැනීමට ශිෂ්‍යයන් උනන්දු කිරීම අවශ්‍ය ය.

ආදර්ශ පුවත්පත් වාර්තාව

"තුරුසරුගම සාහිත අරුණලු"

සී.එල්. පෙරේරා
තුරුසරුගම ප්‍රාදේශීය වාර්තාකරු

තුරුසරුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරන ලද කලා උලෙළ 2018.11.30 දින ප.ව. 2.00ට උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණයේ පැවති මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ප්‍රවීණ කලාකරු සමරනාථ එදිරිසූරිය මහතා ය.

කලා උලෙළ විචිත්‍රවත් කළ මහාචාර්ය සුසිල් රාජකරුණා මහතා විසින් "සාහිත්‍යයේ නව ගමන් මග" යන මැයෙන් හරබර දේශනයක් පවත්වන ලදි. ස්වාධීන ව නිර්මාණ බිහිකිරීම හා ඒ සඳහා උනන්දුවක් දක්වන ලේඛකයන් දිරිමත් කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සැමගේ විශේෂ අවධානය යොමු විය යුතු බව, එතුමා ප්‍රකාශ කළේ ය.

අනතුරු ව වාර්ෂික කලා උලෙළ නිමිත්තෙන් පැවති රචනා, නවකතා, පද්‍ය නිර්මාණ, කවික, චිත්‍ර තරගවලින් ජයග්‍රහණ ලබූ ජයග්‍රාහකයන්ට තිළිණ හා සහතික පත් පිරිනැමීම ද, ප්‍රදේශයේ සාහිත්‍යකරුවන් තිදෙනෙකුට "සාහිත්‍ය දීපනී" සම්මාන පිරිනැමීම ද, සිදු විය. නැටුම් ගැයුම් ආදි විචිත්‍රාංගවලින් වර්ණවත් වූ මෙම උත්සවය, ප්‍රදේශයට නව ආලෝකයක් ගෙන දුන් අනගි අවස්ථාවක් විය.

## 2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 02යි.**
**මුළු ලකුණු 80කි.**

සිංහල භාෂාව හා සාහිත්‍යය III **ප්‍රශ්න පත්‍රය** ප්‍රශ්න 7කින් සමන්විත ය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ ව අපේක්ෂකයන්ගේ අවබෝධය විචාරාත්මක හා තර්කානුකූල දැනුම, භාෂා ඥානය, සාහිත්‍යාවබෝධය හා රසවින්දන හැකියාව පරීක්ෂා කෙරෙන **පළමු ප්‍රශ්නය** සඳහා කොටස් දහයක් ඇතුළත් වේ. එක් කොටසක එක් අනුප්‍රශ්නයටක ලකුණු 1 බැගින් මුළු ලකුණු 20කි.

**දෙවන ප්‍රශ්නය** යොමු වන්නේ නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට ය. මෙහි දී නිර්දිෂ්ට පාඨ පහක් ලබා දෙන අතර ඒ එක් එක් පාඨය ආශ්‍රයෙන් ප්‍රශ්න දෙක බැගින් සැකසෙයි. එම නිර්දිෂ්ට පාඨවල අන්තර්ගත කාව්‍යෝක්ති, දුරවබෝධ පදවල අර්ථ හා අවස්ථා සම්බන්ධය පිළිබඳ විමසීම මෙහි දී අපේක්ෂිත ය. මේ සඳහා එක් කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 20කි.

3-4 ප්‍රශ්න මගින් නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂිත ය. මෙහි දී "නැතහොත්" යන්නෙන් ශිෂ්‍යයාට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට අවස්ථාව ලැබෙයි. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් වෙන් කර ඇත.

5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු ය. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයන් සතුව පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීම ය. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත.

### 2.3.2 III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයේ 1, 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

**පළමුවන ප්‍රශ්නය** මගින් නිර්දිෂ්ට සාහිත්‍ය සංග්‍රහයේ එන සාහිත්‍යමය පාඩම් ඇසුරෙන් කෙටි පිළිතුරු සැපයිය හැකි අනුප්‍රශ්න දහයක් ඉදිරිපත් කර ඇත. එම අනුප්‍රශ්න දහය ද (අ) - (ආ) ලෙස ප්‍රශ්න කොටස් දෙකකට ද බෙදා ඇත. ඒ එක් කොටසකට හිමි වන්නේ ලකුණු එක බැගිනි. ඒ අනුව කොටස් විස්ස සඳහා ලකුණු 20ක් හිමි වේ. පළමුවන ප්‍රශ්නය සඳහා පහසුතාව 52%කි.

**දෙවන ප්‍රශ්නය** යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල ගද්‍ය - පද්‍ය පාඨ ඇසුරෙන් අපේක්ෂකයන් සතු සාහිත්‍යමය දැනුම පරීක්ෂා කිරීමට ය. මෙහි දී නිර්දිෂ්ට පාඨ පහක් ලබා දෙන අතර ඒ ඒ පාඨය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. මේ සඳහා එක් කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 20කි. දෙවන ප්‍රශ්නය සඳහා පහසුතාව 35%කි.

3-4 ප්‍රශ්නවලින් නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයන්ගේ විශ්ලේෂණාත්මක දැනුම ඇගයීම මූලික අපේක්ෂාව ය. මෙහි දී "නැතහොත්" යන්නෙන් අපේක්ෂකයන්ට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට ද අවස්ථාව ලැබේ. මේ ප්‍රශ්නයට ලකුණු 15ක් හිමි වේ.

**තුන්වන ප්‍රශ්නය** කොටස් 2කින් සමන්විත වන අතර වැඩි ම පහසුතාව 71%ක් ලබා ගෙන ඇත්තේ හංස සන්දේශය ඇසුරෙන් සම්පාදිත ප්‍රශ්නයට ය. අඟුල්මල් දමනය ඇසුරෙන් සම්පාදිත ප්‍රශ්නයේ පහසුතාව 51%කි. තුන්වන ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 60%කි.

**හතරවන ප්‍රශ්නය** ද කොටස් දෙකකින් යුක්ත වන අතර "හානාහීය පානා අඬහැරෙන් දැනේ" ජන කවි පෙළ ඇසුරෙන් සම්පාදිත ප්‍රශ්නයේ පහසුතාව 65%ක් වන විට මෙහි නැතහොත් යනුවෙන් දක්වා ඇති සිංහබාහු නාට්‍යය ඇසුරෙන් සම්පාදිත ප්‍රශ්නයේ පහසුතාව 33%කි. හතරවන ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 62%කි.

**5, 6, 7** ප්‍රශ්නවලින් අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුත්තේ එක් ප්‍රශ්නයකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයන් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීම යි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත. මෙහි දී වැඩි ම පහසුතාව 68%ක් ලබා ගෙන ඇත්තේ 7 ප්‍රශ්නයට වේ. අඩු ම පහසුතාව 43%ක් වූ අතර එය ප්‍රශ්න අංක 5 සඳහා ලබා ගෙන තිබුණි.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යූහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ කුමක් ද?

(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍ය **දෙකක්** නම් කරන්න.

(ii) ගුත්තිල ඇදුරු **සඳ**

......................................

......................................

සුදුසු අස්නෙක ගොසින් උන් **සඳ**

(අ) මෙම කවියේ මැද පේළි දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iii) "මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ?"

(අ) මෙම පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(iv) **නිදහස මහ මුහුදක්** **වේ**
එහි උල්පත පුත, නුඹ වේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?

(ආ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් පැදි පෙළේ නම කුමක් ද?

(v) "මම යන්නට නොනිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැති."

(අ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය රචිත යුගය නම් කරන්න.

(ආ) මෙහි සඳහන් විශ්වාස නොකට යුතු සතර දෙනාගෙන් එක් අයකු සඳහන් කරන්න.

(vi) (අ) 'අපට වැසිකිළියක්' කෙටිකතාව ඇතුළත් කෙටිකතා සංග්‍රහය නම් කරන්න.

(ආ) මෙම කෙටිකතාවේ රචකයාගේ නම කුමක් ද?

(vii) "හොඳට ම වැඩි වුණොත් ඒක වටීවි ජරුන්කු පන්සීයක්"

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?

(ආ) මෙහි 'ජරුන්කු' යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

(viii) සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ

(අ) මේ පද්‍ය ඛණ්ඩය මුලින් ම පළ වූ කෘතිය කුමක් ද?

(ආ) මේ කෘතියේ රචකයා විසින් රචනා කරන ලද නවකතා **දෙක** නම් කරන්න.

(ix) (අ) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය නම් කරන්න.

(ආ) "**ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව**
ඇදී ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන් ය"
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාඨයෙන් පැවසෙන අදහස ලියන්න.

(x) (අ) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය **දෙකක්** නම් කරන්න.

(ආ) "සකිසඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර"
මෙහි 'සකිසඳ' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇත්තේ කාට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) මහෞෂධ පණ්ඩිතුමාගේ/බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රඥා මහිමය කියාපෑම.
(ආ) සසදාවත, මුවදෙව්දාවත, කව්සිළුමිණ

(ii) (අ) වීණා වයන ලෙස ඉඳ
පසෙක පනවන ලද
(ආ) උතුමා/උත්තමයා, උත්තමාර්ථ යන අරුත් ඇති ගෞරවාර්ථ පදයක්
වෙලාවෙ/මොහොතෙ/අවස්ථාවෙ/කල්හි

(iii) (අ) බැද්දේගම
(ආ) පුංචිරාළ / වෙදරාළ / රාළහාමි

(iv) (අ) රූපක / රූපකාලංකාරය
(ආ) ජාතික තොටිල්ල හෙවත් දරු නැළවිල්ල / මුනි සිරිපා සිඹිමින්නේ/දරු නැළවිල්ල

(v) (අ) පොළොන්නරු යුගය
(ආ) සොරා, මුලින් අතුරා වාඩිවී සිටි කොළ, රජතුමා, කාන්තාව

(vi) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා
(ආ) කේ. ජයතිලක මහතා

(vii) (අ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය
(ආ) ප්‍රංශයේ ව්‍යවහාර මුදල් ඒකකය / මුදල් ඒකකයක්

(viii) (අ) ප්‍රබුද්ධ
(ආ) තුං මං හංදිය, මනෝ මන්දිර

(ix) (අ) බිය නොවන් අයියණ්ඩි
(ආ) ග්‍රීෂ්ම / උෂ්ණ / වියළි කාලයේ ගඟේ වතුර අඩුවී, ජලයේ පැහැය වෙනස් වී, ගලා යන බව

(x) (අ) හංස, සැළලිහිණි, ගිරා, කෝකිල, පරෙවි
(ආ) සැළලිහිණියාට

## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර එයට හිමි මුළු ලකුණු ගණන 20කි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති පිරිස 97%කි. අපේක්ෂකයන් පිළිතුරු සපයා ඇති ආකාරය අනුව

ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 17%ක් ද

වශයෙන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී 55%ක පිරිසක් ලකුණු 11ට අඩුවෙන් ද 45%ක පිරිසක් ලකුණු 10ට වැඩියෙන් ද ලබා ගෙන ඇතත් ලකුණු 15ට වැඩියෙන් ලබා ගැනීමට සමත් ව ඇත්තේ 17%ක පිරිසක් පමණි.




මෙම ප්‍රශ්නයේ කොටස් 10ක් ඇතුළත් වේ. (ii) කොටසේ (අ) අනුකොටස සඳහා පහසුතාව 87%ක් ද (x) (අ) අනුකොටසට පහසුතාව 83%ක් ද (i) (අ) අනුකොටසට 78%ක් ද (iv) (ආ) සඳහා 76%ක් ද (vi) (ආ) සඳහා 75%ක් ද වශයෙන් අපේක්ෂකයන් පහසුතාව පෙන්වා ඇත.

මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම කොටස් වන්නේ (v) (ආ) අනුකොටස 22%ක් ද (ix) (ආ) අනුකොටස 26%ක් ද වශයෙනි. පොදුවේ ගත් කල සෙසු අනුකොටස් සඳහා පහසුතාව 33% සිට 70% දක්වා ලබා ගෙන ඇති බව පෙනේ.

මෙම දත්ත විශ්ලේෂණය කළ විට පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකි ය. ඒ අනුව (v) (ආ) පුරාතන ගද්‍ය කෘති ඇසුරින් සැකසූ "අඟුල්මල් දමනය" පාඩමේ අවබෝධය සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නයකි. එම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී අඩු පහසුතාවක් පෙන්නුම් කිරීමෙන් පැහැදිලි වන්නේ නිර්දිෂ්ට පුරාතන ගද්‍ය කෘති පරිශීලනය සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන දුර්වලතාව යි.

එසේ ම (ix) (ආ) ප්‍රශ්නය නූතන පද්‍ය ඇසුරින් සැකසූ ප්‍රශ්නයක් වන අතර එහි පහසුතාව 26%ක් පමණ අඩු වීමට හේතු වී ඇත්තේ පද්‍ය රසවින්දනයේ දී ඉගෙන ගත යුතු වාච්‍යාර්ථ සහ කවියාගේ වෙනත් නිර්මාණ පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීම යි.

මෙම තත්ත්වය මගහරවා ශිෂ්‍යයන්ගේ ප්‍රශස්ත මට්ටම ඉහළ අගයකට ගෙන ඒමට නම් 10, 11 සාහිත්‍ය පොත් පූර්ණ ලෙස පරිශීලනය වන ආකාරයේ කෙටි ලිඛිත අභ්‍යාස පන්ති කාමරයේ දී නිරතුරුව ම කරවීමට හා සාකච්ඡා කිරීමට ගුරුවරයා වග බලා ගත යුතු ය.

නිර්දිෂ්ට ග්‍රන්ථ අනුසාරයෙන් අනුමාන ප්‍රශ්න සකසා පිළිතුරු ලිවීම, පසුගිය ප්‍රශ්න පත්‍රවල ඇති එම ප්‍රශ්නය තෝරා ගෙන පිළිතුරු ලිවීම, පාඩමෙන් පාඩමට හා වාරයෙන් වාරයට නියමිත පාඩම් ඇසුරින් ප්‍රශ්න සකසා පිළිතුරු ලිවීමට පෙලඹවීම, වාචික කෙටි ප්‍රශ්න තරග පැවැත්වීම හා අදාළ කවි පන්ති වනපොත් කරවීමට ගුරුවරයා ක්‍රියාත්මක වුවහොත් මෙම දුර්වලතාව සම්පූර්ණයෙන් මගහරවා ගෙන ඉතා ඉහළ සාධන මට්ටමක් කරා යාමට ශිෂ්‍යයන්ට හැකි වේ.

02 ප්‍රශ්නය

අපේක්ෂණය : දෙවන ප්‍රශ්නය ද අනිවාර්ය ය. මෙහි දී නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇති ව පාඨය ඇසුරෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරිණි. මෙහි දී ලිහිල් බසින් ලිවීම, කාව්‍යාලංකාර හා අවස්ථා සම්බන්ධය දැක්වීම, දුරවබෝධ වචනවලට අරුත් සැපයීම අපේක්ෂකයා විසින් සිදු කළ යුතු ව තිබිණි.

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **රිවි තැවුලේ** පිපි කමලේ විල් ගැවසී
**මත කොවුලේ** තුරු වදලේ හඬන නිසී
වන සැවුලේ මඟ අසලේ පොර සැලසී
ගුරු බැවුලේ යව අවුලේ නොවී කිසී

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**(ආ)** මෙම කවියෙන් කියැවෙන ගුරු බැවුලේ ස්වභාවය විස්තර කරන්න.

(ii) "තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙම්හ."

**(අ)** මෙහි තරම් නොවෙයි යන්නෙන් අදහස් කළේ කුමක් ද?

**(ආ)** මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තා දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?

(iii) "තො අඟුල්මල්හු කෙහෙ බහා සිවුරු හැඳ පෙරෙවැ පැවිජි වැ පණිවා ඈ පව්කැමින් විරත වැ එක් වෙලෙ වළඳා බඹසරවත් රැකැ සිල්වත් වැ කලණදහම් පුරා වසන්නහු දිටිහි නම්, උහුට කුමක් කෙරෙහි?"

**(අ)** මෙම පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

**(ආ)** මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) දුටු සත සිතට තුටු වන ලෙසට නිතියෙනි
සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි
පැහැපත සුද නොහළ වැලි අතුළ මළු තැනි
මිහිකත සඳුන්'ලෙව් දුන් උර මඬල වැනි

**(අ)** ඉහත සඳහන් කවියෙහි අන්තර්ගත උපමා **දෙකක්** ලියන්න.

**(ආ)** සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v) රැති වනපෙතිනැවිදින් **සුමුවෝයා**
නිති මියුරැති වෙණ නදළමුවෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් **සමුවෝයා**

**(අ)** තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

**(ආ)** මුවන්ගේ මෙම හැසිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ලකුණු 04 × 5 = 20 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) (අ) **රිවි තැවුලේ** - සූර්ය තාපය / හිරු රැසින් තැවී ගිය / සූර්ය රශ්මියෙන් තැවී ගිය / හිරු රැසින් පීඩාවට පත් / සූර්ය තාපයෙන් තැවී ගිය

**මත කොවුලේ** - ප්‍රීතියෙන් උද්දාමයට පත් වූ කොවුලන් / මත් වූ කෝකිලයන් / මත් වූ කොවුලන්

(ආ) හිරු රැසින් පිපුණු නෙලුම් මල්වලින් යුක්ත විල් පැවතීම
මත් වූ කෝකිලයන් තුරු වදුලේ සිට මැනවින් නාද කිරීම
වලිකුකුළන් මාර්ගය අසල පොරයෙහි යෙදී සිටීම

(iii) (අ) ඔබ / නුඹ (කොසොල් රජ) අංගුලිමාල කෙස් කපා / හිස මුඩු කොට සිවුරු ඇඳ, පොරවා ගෙන පැවිදි වී ප්‍රාණඝාත / සතුන් මැරීම ආදි පාප කර්මවලින් ඉවත් වී (දවසකට) එක් වේලක් පමණක් ආහාර ගනිමින් බ්‍රාහ්මචාරී / උතුම් හැසිරීම්වලින් යුතු ව සිල් ආරක්ෂා කරමින් කල්‍යාණ ධර්ම / යහපත් ධර්ම අනුගමනය කරමින් වාසය කරන අයුරු දුටුවේ නම් ඔහුට කුමක් කරන්නෙහි ද?

(ආ) කොසොල් රජතුමා අංගුලිමාල ඇල්ලීමට යන බව ප්‍රකාශ කළ අවස්ථාවේ දී බුදුන් වහන්සේ කොසොල් රජතුමාගෙන් මෙසේ විමසූ සේක.

(iv) (අ) බෙර ඇසක් මෙනි

සඳන්'ලෙව් දුන් උරමඬල වැනි

(ආ) දකින ජනයාගේ සිතට නිත්‍ය වශයෙන් ම සතුට ඇති වන ලෙස සතර පැත්තෙන් ම එකම ආකාරයට බෙර ඇසක් මෙන් සමතලා කර සුදු පැහැති ලස්සන වැලි ඉස ඇති විහාර මිදුල් මහී කාන්තාවගේ සඳුන් ආලේප කළ උර ප්‍රදේශය මෙනි.

(v) (අ) සුමුවෝයා රංචු ගැසී / එකට එක් වී / එක් රැස්වී / කාණ්ඩ වශයෙන් එකතු වී

සමුවෝයා හමු වී / සම්මුඛ ව / අභිමුඛ ව

(ආ) ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනයේ මිහිරි බව

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර දෙස බැලීමේ දී මෙම ප්‍රශ්නය තෝරා ගැනීම 93%ක ප්‍රතිශතයක් වුව ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කර ඇත්තේ අඩු ප්‍රතිශතයකි.
ඒ අනුව
ලකුණු 00-05 ප්‍රාන්තරයෙහි 46%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයෙහි 27%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයෙහි 20%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයෙහි 7%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 11ට අඩුවෙන් ලබා ඇති පිරිස 73%කි. ලකුණු 15ට වැඩියෙන් ලකුණු ලබා ගත් පිරිස 7%කි.




මෙම ප්‍රශ්නයේ පහසුතාව පිළිවෙළින් I කොටස (අ) 19%ක් ද (ආ) 29%ක් ද II කොටස (අ) 42%ක් ද (ආ) 10%ක් ද III කොටස (අ) 47%ක් ද, (ආ) 31%ක් ද iv කොටස (අ) 66%ක් ද (ආ) 37%ක් ද v කොටස (අ) 19%ක් ද, (ආ) 46%ක් ද විය.

සමස්තයක් වශයෙන් ගත් කල ගද්‍ය, පද්‍ය. කොටස්වල දුරවබෝධ වචනවල අර්ථ පැහැදිලි කරදීමත්, අර්ථාවබෝධය වර්ධනය කරවීමට පන්ති කාමරය තුළ ශිෂ්‍යයන් යොමු කරවීමත් වැදගත් වේ. විශේෂයෙන් ම කළු අකුරින් දක්වා ඇති වචනවල පමණක් නොව සමස්ත කොටසේ ම අර්ථ ලිවීමේ වැදගත්කම ශිෂ්‍යයන්ට අවධාරණය කළ යුතු වේ.

නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨවල දුරවබෝධ වචනවල තේරුම් මතකයේ තබා ගැනීමට යොමු කරවීම, සතතාභ්‍යාසවල යෙදවීම මගින් සාර්ථක පිළිතුරු අපේක්ෂා කළ හැකි ය. පුරාතන සාහිත්‍යයේ ගද්‍ය-පද්‍ය පාඩම්වල කතාසාරය මෙන් ම අවස්ථා හා සිද්ධි මතකයේ රැඳෙන ආකාරයට ඉගැන්වීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර එමගින් ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම් වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසා දීම ද වැදගත් වේ.

තව ද සිසුන්ට මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් බව ද ඒ සඳහා ලකුණු 20ක් පහසුවෙන් ම කෙටි කාලයක් තුළ ලබා ගත හැකි බව ද අවධාරණය කිරීම ගුරුවරයාගේ වගකීමකි. එපමණක් නොව පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී විවිධ ඉගෙනුම් ක්‍රමශිල්ප අනුගමනය කරමින් විනෝදය සමගම ධාරණ ශක්තිය වැඩි දියුණු වන අයුරින් පාඩම සංවර්ධනය කළ යුතු ය. දී ඇති දුරවබෝධ වචනවල පමණක් නොව අදාළ කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලිවීමට හුරු කළ යුතු ය. මේ සඳහා මාසික පරීක්ෂණ, ඇගයීම් ආදි කටයුතුවල දී පාඩමෙන් පාඩමට අවස්ථා සම්බන්ධය පිළිබඳ ව සාකච්ඡා කිරීමෙන් ද කෙටි ඡේද හා කවි දී ඒවායේ අර්ථ ලියවමින් සාකච්ඡා කිරීමෙන් ද පසුගිය ප්‍රශ්න පත්‍රවල එම ප්‍රශ්නයට පිළිතුරු ලියවමින් සාකච්ඡා කිරීමෙන් ද සාධන මට්ටම ඉහළට ගෙන යා හැකි ය.

03 ප්‍රශ්නය

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම.

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - ලකුණු 15 බැගිනි.
5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - ලකුණු 10යි.

**3.** බාහිර බලවේග නිසා පුද්ගල මනෝභාවයන්

(i) ප්‍රචණ්ඩත්වය කරා යොමු වන අයුරුත්

(ii) යළිත් ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන අයුරුත් 'අඟුල්මල් දමනය' කතාවෙන් මනාව නිරූපණය වෙයි. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

03. පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩත්වය හා ශික්ෂාකාමිත්වය උදෙසා බාහිර බලවේග හේතු වන ආකාරය අඟුල්මල් දමනය කතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් විමර්ශනය කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**(i) ප්‍රචණ්ඩත්වය කරා යොමු වන ආකාරය**

★ දිසාපාමොක් ඇදුරුතුමාගේ නියෝගය

★ වෙනත් ශිෂ්‍යයන්ගේ කේලාම් බස්

**(ii) ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන ආකාරය**

★ බුදුන් වහන්සේ හමුවීම හා එහි දී ඇති වන සාකච්ඡාව මගින් කරුණු අවබෝධ වීම

★ දරුණුකම නිසා ප්‍රචලිත වූ අංගුලිමාල යන නම වෙනුවට කොසොල් රජු 'භර්ගයො මන්ත්‍රාණි පුත්‍ර' යනුවෙන් මවුපියන්ගේ නම් මූලික කොට ගෙන තෙරුන් වහන්සේ හඳුන්වනු ලැබීම

★ සත්‍යක්‍රියා කොට මූඪගර්භ කාන්තාව සුවපත් කිරීමෙන් පසු සමාජය විසින් අංගුලිමාල තෙරුන්ගේ යහපත් භාවය හා කරුණාවන්ත භාවය අගය කරනු ලැබීම

උදාහරණ සඳහා ලකුණු 04යි
සමස්ත විස්තරයට ලකුණු 11යි
මුළු ලකුණු 15යි

**නැතහොත්**

(i) පරිසර වර්ණනා රසවත් ලෙස ඉදිරිපත් කිරීමටත්

(ii) යමක අසිරිය තත්ත්වාකාරයෙන් දැකීමටත් හංස සංදේශ කතුවරයා දක්වා ඇති කුසලතාව අගය කළ හැකි ය. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

නැතහොත්
කැරගල ගම හා වෙහෙර වැනුම ඇසුරු කර ගෙන කතුවරයා පරිසර වර්ණනයෙහි දක්වන දක්ෂතාව හා යමක අසිරිය තත්ත්වාකාරයෙන් දකින ආකාරය ඉදිරිපත් කළ යුතු ය.

(i) පරිසර වර්ණනා රසවත් ලෙස ඉදිරිපත් කරන ආකාරය

★ කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරැය...........

★ සාර පලය අඹ දඹ ද වල්පිට.............

★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට............

★ මිහ'ඹ මුවමඬල මෙන් දිලෙන හැම විට...........

★ නුදුරු වැ සිහිලැ'ලීය ගඟුලැ'ලී ය.........

★ පවන'ද පිපි තුරේ ය නිර තුරේ ය...........

(ii) යමක අසිරිය තත්ත්වාකාරයෙන් දැකීමේ කුසලතාව දක්වන ආකාරය

- ★ කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරැය...........
- ★ සාර පලය අඹ දඹ ද වල්පිට............
- ★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට...........
- ★ මිහ'ඹ මුවමඬල මෙන් දිලෙන හැම විට..........
- ★ නුදුරු වැ සිහිලැ'ලීය ගඟුලැ'ලී ය.........
- ★ පවන'ද පිපි තුරේ ය නිර තුරේ ය..........

උදාහරණ සඳහා ලකුණු 04යි
සමස්ත විස්තරයට ලකුණු 11යි
මුළු ලකුණු 15යි

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




තුන්වන ප්‍රශ්නය ද අනිවාර්ය ප්‍රශ්නයකි. අපේක්ෂකයන්ගෙන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ 86%ක් පමණි. මෙම ප්‍රශ්නයට ලකුණු 15ක් හිමි වෙයි.

ලකුණු 00-03 ප්‍රාන්තරයෙහි 19%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙහි 18%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙහි 29%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙහි 34%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 08ට අඩුවෙන් ලබා ගත් පිරිස 37%කි. අපේක්ෂකයන්ගෙන් 34%ක් ලකුණු 11ට වැඩියෙන් ලබා ඇත.




3 ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 53%ක ප්‍රතිශතයක් "අඟුල්මල් දමනය" ඇසුරින් සම්පාදිත ප්‍රශ්නය තෝරා ගෙන ඇති අතර 47%ක ප්‍රතිශතයක් "හංස සන්දේශය" ඇසුරින් සම්පාදිත ප්‍රශ්නය තෝරා ගෙන ඇත.







තව ද මෙය විකල්ප ප්‍රශ්න සහිත පැනයක් බැවින් ඉන් එකකට පමණක් පිළිතුරු ලිවිය යුතු බව ශිෂ්‍යයන් අවධානයට ගත යුතු ය. ප්‍රශ්න ව්‍යූහගත ස්වරූපයෙන් ඉදිරිපත් කළත් ලකුණු පිරිනමනුයේ සමස්ත පිළිතුරෙහි නිදසුන් සඳහා (එක් නිදසුනකට එක ලකුණ බැගින්) ලකුණු 04ක් ද විචාරශීලී ව කරුණු ඉදිරිපත් කිරීම සඳහා ලකුණු 11ක් ද වශයෙනි. ඒ අනුව අවසන් ලකුණ වශයෙන් ලකුණු 15ක් මෙම ප්‍රශ්නය සඳහා හිමිවන බව ශිෂ්‍යයන් දැනුවත් කිරීම ගුරුවරයා සතු කාර්යභාරයකි.

ඒ අනුව මෙවර 3 ප්‍රශ්නය සකසා ඇත්තේ "අඟුල්මල් දමනය" ඇසුරෙනි. එහි පහසුතාව 51%කි. පිළිතුරු සඳහා නිදසුන් දැක්වීමේ දී අපේක්ෂක පහසුතාව 55%කි. ප්‍රශ්නයට අදාළ ව නිදසුන් තෝරා ගැනීමේ දී අපේක්ෂකයන්ට එය අපහසු වී ඇත. ඒ පිළිබඳ ව ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු ය. එම ප්‍රශ්නයට විචාරාත්මක ව අදහස් ප්‍රකාශ කිරීමේ පහසුතාව 49%කි. අපේක්ෂකයන්ට මෙම ප්‍රශ්නයට අදාළ ව කරුණු ප්‍රමාණවත් ලෙස පෙළගැස්වීමට නොහැකි වීම එයට හේතු වී ඇත. එබැවින් පුරාතන ගද්‍ය සාහිත්‍ය ඇසුරෙන් විචාරශීලී ව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන් පෙලඹවීම සඳහා සුදුසු අභ්‍යාසකරණයෙහි යෙදවීම ගුරුභවතා සතු වගකීමකි. පුරාතන ගද්‍ය කොටස් මැනවින් විග්‍රහාත්මක ව හා විචාරාත්මක ව අවස්ථා සිද්ධි හා චරිත ද පිළිබඳ සාකච්ඡා කරමින් එමගින් නිරූපිත සමාජ විවරණය හා ඒ අනුසාරයෙන් ලැබිය හැකි ජීවිතාවබෝධය සිසුන්ට පෙන්වා දීමට ගුරුවරයා උනන්දු විය යුතු ය.

3 ප්‍රශ්නයට අදාළ විකල්ප ප්‍රශ්නය සැකසී ඇත්තේ "හංස සංදේශය" ඇසුරු කරගෙන ය. මෙහි පහසුතාව 71%ක් වැනි ඉහළ අගයක් ගෙන ඇත. එම ප්‍රශ්නයට නිදසුන් සැපයීමේ ප්‍රවණතාව 85%ක් වැනි ඉහළ අගයක් ගනියි. පිළිතුරු සැපයීමේ එවැනි පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ අපේක්ෂකයන් උදාහරණ දැක්වීමට අවශ්‍ය පද්‍ය මතකයේ තබා ගැනීම ය. එහෙත් ඊට සාපේක්ෂක ව පිළිතුර සඳහා විස්තරාත්මක ව විචාරශීලී ව පිළිතුරු සැපයීමේ පහසුතාව වී ඇත්තේ 66%කි. ඒ අනුව නිදසුන් ඉදිරිපත් කළ ද විචාරශීලී ව ලිවීමේ හැකියාව මඳ බව පෙනී යයි. එබැවින් සාහිත්‍යය ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාහිත්‍ය නිර්මාණ විචාරශීලී ලෙස සංවාදයකට යොමු කරමින් කරුණු සාකච්ඡා කිරීම මගින් ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා ශිෂ්‍යයන් පෙලඹවීමට ගුරුභවතා ක්‍රියා කළ යුතු ය. ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීමට උපදෙස් ලබා දෙමින් සාර්ථක පිළිතුරක් ගොනු කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම ගුරුභවතා සතු වගකීමකි. තව ද මේ සඳහා පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පන්ති කාමරයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම, ආදර්ශ පිළිතුරු කිහිපයක් සිසුන්ට ලියා ගැනීමට සලස්වා එලෙස පිළිතුරු ගොනු කිරීමට සැලැස්වීම, ශිෂ්‍යයන් විසින් ලියන ලද පිළිතුරු සාකච්ඡා කිරීම මගින් පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන්ට ඇති අපහසුතා හඳුනා ගෙන ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයන්ගේ සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට ශිෂ්‍යයන්ට උපකාර කිරීම ද ගුරුභවතාගේ කාර්යභාරයකි.

04 ප්‍රශ්නය

**4.** (i) **උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත්**

(ii) **පොදු ජන වහර යොදා ගැනීමත් 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' යන ජන කවි පෙළ පාඨකයාගේ සිත් ගනී. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

**නැතහොත්**

(i) **අවස්ථා හා සිද්ධි නිරූපණයත්**

(ii) **භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් සිංහබාහු නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

(ලකුණු 15යි)

අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

පාඨක සිත් ගැනීමට හේතු වූ උපදේශාත්මක හැඟීම් හා පොදු ජන වහර යොදා ගැනීම සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.

(i) **උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීම**
- නහින දෙහින කාලෙට පින් කෙරුම යුත....
- ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු....
- ඇස නැති දා පොත ගත්තේ කියන්ටද....
- එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා....
- අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා....

(ii) **පොදු ජන වහර යොදා ගැනීම**
- නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
- වහින කලට කුරීන් විල්වලින් එත
- වෙර නැති දා ගහගත්තේ දිනන්ට ද
- දත නැති දා උක් දඬු ගිනි තපින්ටද
- ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා
- පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද
- අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා

නැතහොත්

අවස්ථා හා සිද්ධි නිරූපණයත් භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.**
**එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.)**
**(උදාහරණ සඳහා ලකුණු 04යි, සමස්ත විස්තරයට ලකුණු 11යි, මුළු ලකුණු 15යි)**

**(i) අවස්ථා හා සිද්ධි නිරූපණය**

★ සිංහබාහු හා සිංහසීවලී තුළ පැවති සැකය දුරු කිරීමට සුප්පා දේවිය දරන උත්සාහය හා ඇගේ ක්‍රියාකලාපය දැක්වෙන අවස්ථා

★ ලෙනෙන් පිට ව යාමට දරන ප්‍රයත්නය

★ සුප්පා දේවිය දෙගිඩියාවකට පත් වන අවස්ථාව

★ සිංහයාගේ ප්‍රකෝපකාරිත්වය හා පශ්චාත්තාපය දක්වන අවස්ථාව

**(ii) භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරය**

- **අවස්ථාවට යෝග්‍ය ලෙස භාෂාව යොදා ගැනීම**

  සිංහබාහුගේ සිත තුළ පවතින සැකය

  සිත නොම සැනසේ හිඳිනට මෙලෙසේ  දිවි හිමියෙන් මෙ ලෙනේ

  අප නරයන් වග පැවසූ එඅරුමය  නැත මට වැටහෙන්නේ

- **ලෙනෙන් පිට ව යාමට දරන උත්සාහය**

  තුමුල ගතින්දා  බාහු බෙලෙන්දා

  වෙමි සේ තිදසින්දා

  කුරිරු ගිජින්දා  කුඹු තල සින්දා

  ලමි සේ කෙසරින්දා

  මා පිය මිගිඳා කරනා විකුමන්

  ඇයි මට බැරි වන්නේ

- **සුප්පා දේවියගේ සිතෙහි දෙගිඩියාව**

  දෙවියන් බාරයි මා සමිඳා

  මා වෙත නොවනු ය කෝපා

  දරුවන් සන්දා  කරනෙමි මෙබන්දා

- **සිංහයාගේ ප්‍රකෝපකාරී ස්වභාවය**

  ගල් ලෙන බිඳලා

  ලෙන් දොර හැරලා

  සිංහබා සිංහබා සිංහබා

  ලෙන තුළ නො වෙති

  පෙරළා නො එති

  මම දැන ගතිමි මම සැක කළෙමි

  හෙණයක් සේ පතිත වූ අහසින්

  හිස මතට දෙදරුම් දී

  බමවා ම ඉඳුරන් අඳුරු කරමින්

  පහරිනා රුදුරු

- **චරිතවලට යෝග්‍ය ලෙස භාෂාව යෙදීම**

  සුරතල් දියණිය  මොලකැටි වදනින්

  මා සනසන්නිය  අහර පිසන්නිය

  කවන්නිය, පොවන්නිය

  මා ගැන බිය වන්නිය

  සේ රිවි බිම්බා පතළ තෙද බලැති  මහරු

  මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන්  සපිරු

ඔබ දෙදෙන මා සමග
නො ආවොත් යන්ට වේ
ඔබ දමා මේ ලෙනේ
මට උරුම වූ දිවිය
මා සොයා යා යුතුයි
කුමක් දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ
සෙතක්දෝ

★ උපමාලංකාර සහිත භාෂා භාවිතය, අනුප්‍රාසවත් භාෂා ව්‍යවහාරය, ගීතමය භාෂා යෝජනය, සම්භාව්‍ය සාහිත්‍ය භාෂා භාවිතය හා විවිධ රස ජනනය වන යෙදුම් ආදි කරුණු යටතේ උදාහරණ දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය ය.

ඉහත සඳහන් අංශ දෙක සඳහා දී ඇති නිදසුන් හෝ වෙනත් නිදසුන් දක්වා පැහැදිලි කිරීම අවශ්‍ය වේ.
**(උදාහරණ සඳහා ලකුණු 04යි, සමස්ත විස්තරයට ලකුණු 11යි, මුළු ලකුණු 15යි)**

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




විකල්ප ප්‍රශ්න සහිත මෙම ප්‍රශ්නය ද අනිවාර්ය ය. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත්තේ 83%ක් පමණි. මෙහි පළමු ප්‍රශ්නය සකස් වී ඇත්තේ "හානා හීය පානා අඬහැරෙන් දැනේ" යන ජන කවි පෙළ ඇසුරෙනි. දෙවන ප්‍රශ්නය සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට පෙළ ඇසුරෙන් සැකසී ඇත.

ලකුණු 15කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා
ලකුණු 00-03 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයේ 15%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 8ට අඩුවෙන් ලබා ගත් පිරිස 28%කි. අපේක්ෂකයන්ගෙන් 40%ක් ලකුණු 11ට වැඩියෙන් ලබා ගෙන ඇත.




4 ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 90%ක බහුතරයක් "හානා හීය පානා අඬහැරෙන් දැනේ." ඇසුරෙන් සම්පාදිත ප්‍රශ්නය තෝරා ගෙන ඇති අතර, "සිංහබාහු" නාට්‍යය ඇසුරෙන් සම්පාදිත ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 10%ක් පමණි.







සිව්වන ප්‍රශ්නය විකල්ප ප්‍රශ්නයක් සහිත අනිවාර්ය ප්‍රශ්නයකි. එම ප්‍රශ්න දෙකින් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් විචාරාත්මක පිළිතුරක් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත ය. පිළිතුරෙහි දැක්වෙන යෝග්‍ය උදාහරණ හතරට ලකුණු 04ක් ද ප්‍රශ්නයට අදාළ ව කරුණු ගොනු කරමින් විචාරාත්මක ව අදහස් ප්‍රකාශනයට ලකුණු 11ක් වශයෙන් ලකුණු හිමි වේ. ඒ අනුව ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු සංඛ්‍යාව 15කි.

අපේක්ෂකයන් පිළිතුරු සැපයීමේ දී "හානා හීය පානා අඬ හැරෙන් දැනේ" යන ජන කවි ආශ්‍රයෙන් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නයට උදාහරණ සැපයීමේ දී 85%ක් වැනි සාධන මට්ටමක් දැක් වුව ද ඊට අදාළ ව විචාරාත්මක අදහස් දැක්වීමේ දී 58%ක සාධන මට්ටමක් දක්වා ඇත්තේ උදාහරණ නිවැරදි ව දැක්වීමට සමත් වුවත් සාර්ථක ව විචාරාත්මක පිළිතුරක් සැපයීමට ශිෂ්‍යයන් අසමත් වී ඇති නිසා ය. මෙම ප්‍රශ්නයේ පහසුතාව 65%කි. ප්‍රශ්නයට ඉහළ ලකුණක් ලබා ගැනීමට නම් විචාරාත්මක ව පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන් පුහුණු කළ යුතු ය. ජන කවියා ජීවන පරිඥානයෙන් යුතු ව සමාජය දැනුමින් පෝෂණය කිරීමටත් ගැමියාගේ චින්තනය හැඩ ගැස්සවීමටත් යහ ආකල්ප වර්ධනයටත් මෙම ජන කවි ඉවහල් කර ගෙන ඇති අයුරු ශිෂ්‍යයන්ට පෙන්වා දීම ගුරු භවතාගේ වගකීමකි.

හතරවන ප්‍රශ්නයෙහි නැතහොත් ප්‍රශ්නය සකස් කර ඇත්තේ සිංහබාහු වේදිකා නාට්‍යය ඇසුරෙනි. මෙම ප්‍රශ්නයේ පහසුතාව 33%කි. ප්‍රශ්නයට සපයා ඇති පිළිතුරු අපේක්ෂිත මට්ටමට නොපැවති බව විශ්ලේෂණයේ දී අනාවරණය වී ඇත. පිළිතුරු සැපයීමේ දී උදාහරණ සඳහා 43%ක කුසලතාවක් දක්වා ඇති අතර විචාරශීලී සාර්ථක පිළිතුරු සපයා ඇත්තේ 29%ක ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ හැකියාව ප්‍රශස්ත මට්ටමක නොපවතින බව අනාවරණය වේ.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී සිංහබාහු නාට්‍යයේ රසවත් අවස්ථා හා සිද්ධි නිවැරදි ව හඳුනා ගැනීමට ශිෂ්‍යයන් අපොහොසත් වී ඇති බව පෙනේ. නාට්‍යයේ නිර්දිෂ්ට කොටසින් ප්‍රේක්ෂකයාගේ අවධානය, කුතුහලය, භාවයන් තියුණු කරන අවස්ථා පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් නිදසුන් ඉදිරිපත් කිරීම මගින් එම අවස්ථා හා සිද්ධි පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කිරීමට කටයුතු කිරීම අවශ්‍ය ය. මේ සඳහා නාට්‍යයේ අදාළ කොටස් වීඩියෝ දර්ශන මගින් හෝ වෙනත් ක්‍රම මගින් අනුකරණාත්මක ව ඉදිරිපත් කරමින් ඉගැන්වීමට යොමු වීමෙන් රසවත් අවස්ථා හා සිද්ධි ශිෂ්‍යයන්ගේ අවධානයට යොමු කිරීම අවශ්‍ය ය.

නාට්‍යයක අවස්ථා හා සිද්ධි කෙරෙහි ප්‍රේක්ෂක අවධානය දිනා ගන්නේ එම අවස්ථා හා සිද්ධි ප්‍රේක්ෂකයා ආකර්ෂණය කර ගන්නා ආකාරයෙනි. නාට්‍යයෙන් ප්‍රේක්ෂකයාගේ භාවයන් තීව්‍ර කරන අවස්ථා පෙන්වා දීම ගුරුභවතාගේ වගකීමකි. ඒ අනුව නාට්‍යයෙන් සතුට, ශෝකය, භීතිය, කුතුහලය, තීව්‍ර කරන අවස්ථා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කිරීමෙන් වඩාත් පහසුවෙන් හා විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට පහසු වනු ඇත.

මෙම ප්‍රශ්නයෙහි දෙවන කොටස සිංහබාහු නාට්‍යයේ භාෂාව හා සම්බන්ධව ය. භාෂාව සම්බන්ධ ව ශිෂ්‍යයන් අදහස් දැක්වීමේ දී සාධන මට්ටමට ඉතා පහළ තත්ත්වයක පවතී. භාෂාව සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ගේ අවධානය යොමු නොවීම නිසා ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ පිළිබඳ ව ගුරු භවතුන්ගේ අවධානය යොමු වීම අවශ්‍ය ය. මෙහි දී නාට්‍යය සඳහා යොදා ගත් භාෂාවෙහි රසවත් බව අනුප්‍රාසාත්මක භාෂාවක් භාවිත කර ඇති අවස්ථා, කාව්‍යාත්මක බස් වහරක් භාවිතය, චරිතවලට උචිත වන පරිදි භාෂාව භාවිත කර ඇති ආකාරය ආදිය කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා ඉදිරිපත් කළ හැකි නිදසුන් මගින් පැහැදිලි කිරීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව සිංහබාහු නාට්‍යයේ භාෂාව සම්බන්ධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවස්ථා සලසමින් මෙවැනි ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරක් ගොනු කිරීමට ශිෂ්‍යයන්ට හුරුවක් ලබා දීමට ක්‍රියා කිරීම ගුරුභවතුන්ගේ වගකීමකි.

5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්නයට ලකුණු දහයක් හිමි වේ. උදාහරණ 3ක් දැක්වීම සඳහා ලකුණු 3ක් ද විස්තරය සඳහා ලකුණු 7ක් වශයෙන් ද ලකුණු පිරිනැමේ. ප්‍රශ්න තෝරා ගැනීමේ දී ඉතා හොඳින් කියවා තමාට වඩාත් පහසුවෙන් පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්නය තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු විය යුතු ය.

5, 6, 7 ප්‍රශ්නවලින් එකකට සියලු ම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු වුවත් ප්‍රශ්න තෝරා ගෙන ඇති පිරිස 85%කි. 5, 6, 7 ප්‍රශ්න තෝරා ගෙන ඇති පිරිස පිළිවෙළින් 18%, 15%, 52% වේ. 5, 6, 7 යන ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 43%, 51%, 68% වශයෙනි.

## 05 ප්‍රශ්නය

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** විරුද්ධවාදීන්ගේ යුද්ධෝපක්‍රමවලට ප්‍රතික්‍රියා දැක්වීමේ දී මහෞෂධ පඬිවරයා පෙන්වූ කුසලතාව උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

පහත දැක්වෙන කරුණු ආශ්‍රිත ව විමර්ශනය කිරීම මෙහි දී වැදගත් වේ.

- සතුරු පක්ෂයේ යුද්ධෝපක්‍රම දැන ගැනීම සඳහා චරපුරුෂයන් යෙදීම
- ජලය, වී සහල්, දර ආදිය ඇතුළු නුවරට ගෙන යාම නැවැත්වීමේ උපක්‍රමය ව්‍යාර්ථ කිරීම
- ජයපානෝත්සවය පැවැත්වීමට ඉඩ නොදීම
- මියුලු නුවර වටලා ගත් පසු සැණකෙළි පැවැත්වීම
- ධර්ම යුද්ධය ජයග්‍රහණය කිරීම

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.)

**උදාහරණ සඳහා ලකුණු 03යි**

**සමස්ත විස්තරයට ලකුණු 07යි**

**මුළු ලකුණු 10යි**

## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය උම්මග්ග ජාතකය ඇසුරෙන් සැකසී ඇත. අපේක්ෂකයන්ගෙන් 18%ක් ඊට පිළිතුරු සපයා තිබිණ. සමස්ත පහසුතාව 43%කි. ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා ලබා ඇති ලකුණු ගණනය කිරීමේ දී

ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරයේ 24%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරයේ 22%ක් ද

ලකුණු ලබා ගෙන ඇත.




5, 6, 7 යන ප්‍රශ්නවලින් අඩු ම පහසුතාවක් ලබා ගෙන ඇත්තේ 5 ප්‍රශ්නය යි. මෙයට හේතුව පුරාතන ගද්‍ය සාහිත්‍යයට අදාළ ප්‍රශ්නවලට වඩා නූතන සාහිත්‍ය කෘති ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අපේක්ෂකයා වැඩි නැඹුරුවක් දැක්වීම ය. මෙම නිර්දිෂ්ට පුරාතන නූතන, ගද්‍ය, පද්‍ය සාහිත්‍ය කෘති ඇසුරෙන් විමසිය හැකි ඕනෑ ම ප්‍රශ්නයක් තෝරා ගැනීම කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කිරීමත් නිරන්තර අභ්‍යාසවල යෙදවීමත් පුරාතන, නූතන, ගද්‍ය, පද්‍ය සාහිත්‍යය රසවත් ව ඉගැන්වීමෙන් ඒ පිළිබඳ ව රුචියක් ඇති කිරීමත් මගින් උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකි ය. ඒ පිළිබඳ ව ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

5 ප්‍රශ්නය තෝරා ගත් පිරිස 6 ප්‍රශ්නය තෝරා ගත් පිරිසට වඩා වැඩි නමුත් 5 ප්‍රශ්නය සඳහා සැපයූ පිළිතුරු 6 ප්‍රශ්නය සැපයූ පිළිතුරු තරම් සාර්ථක වී නොමැත.

අපේක්ෂකයන් පුරාතන ගද්‍ය පාඨ කියවීමට, රස විඳීමට යොමු නොවීම එයට එක් හේතුවක් ලෙස දැක්විය හැකි ය. එම තත්ත්වය මගහැරවීම සඳහා පන්ති කාමරයේ දී පුරාතන ගද්‍ය පාඩම් ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳ ව ගුරුවරයා සැලකිලිමත් විය යුතු ය. ඒ සඳහා විවිධ ක්‍රම අනුගමනය කිරීම හා හැකි සෑම අවස්ථාවක දී ම දුරවබෝධ වචන සඳහා සරල, ලිහිල් වචන භාවිත කරමින් අර්ථාවබෝධ කරවීමට විවිධ ක්‍රම අනුග මනය කිරීමට ගුරුවරුන් උත්සුක විය යුතු ය. ඒ සඳහා නාට්‍යානුසාරයෙන් භූමිකා රංගනය මගින් අදාළ අවස්ථා ශිෂ්‍යයාට හොඳින් වැටහෙන පරිදි ඉගැන්වීමෙන් පුරාතන ගද්‍ය පාඩම් ඇසුරෙන් අසන ප්‍රශ්න සඳහා පහසුතාව මීට වඩා වර්ධනය කර ගත හැකි අතර මේ සඳහා පන්ති කාමරයේ දී ගුරුභවතුන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතු ය. පන්ති කාමරය තුළ පාඩම ඇසුරෙන් විවිධාකාර චරිත ලක්ෂණ මතු කරවීම ඒවා වගුගත කර දැක්වීම, ප්‍රධාන චරිතවල දක්ෂතා පෙළගැස්වීම ආදි ක්‍රමවේද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අනුගමනය කිරීමෙන් නිදසුන් සහිත ව නිගමනවලට එළඹීමේ හැකියාව ශිෂ්‍යයා ලබා ගනී. එවිට මෙම ගැටලු සහගත තත්ත්වය මග හරවා ගෙන පහසුතාව වර්ධනය කළ හැකි ය.

ප්‍රශ්න අංකය - 6

**6.** **පවුල් සංස්ථාවේ සමබරතාව ආරක්ෂා කිරීමේ දී ස්වාමි පුරුෂයකුගේ වගකීම මැනවින් නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටිකතාවේ ලොයිසල්ගේ චරිතය උපයෝගි කරගත් ආකාරය උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.** (ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

ලොයිසල් සැමියකුගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීමට උත්සාහ ගත් ආකාරය දැක්වීමේ දී පහත සඳහන් නිදසුන් දැක්විය හැකි ය.

- ⋆ අධ්‍යාපන අමාත්‍යවරයාගේ ප්‍රිය සාදයට සහභාගි වීම සඳහා ආරාධනා පත්‍රය ලබාගැනීම
- ⋆ තම බිරිඳ සකසන ආහාරවල රසය අගය කිරීම
- ⋆ බිරිඳට ඇඳුමක් මිල දී ගැනීම වෙනුවෙන් තම මුදල් පරිත්‍යාග කිරීම
- ⋆ තම බිරිඳගේ සතුට වෙනුවෙන් උත්සව අවස්ථාවේ කාමරයකට වී රාත්‍රි කාලය ගත කිරීම
- ⋆ තම බිරිඳ ගැටලු සහගත තත්ත්වයකට පත් වූ විට ඇයට සහාය වීම සඳහා බොහෝ දුක් විඳීම

**උදාහරණ සඳහා ලකුණු 03යි**
**සමස්ත විස්තරයට ලකුණු 07යි**
**මුළු ලකුණු 10යි**

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 15%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ලකුණු 00-02 අතර ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරයේ 27%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 45%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 06 ට අඩුවෙනි. ලකුණු 05ට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 55%කි.




"දියමන්ති මාලය" කෙටිකතාව ඇසුරෙන් සැකසුණු මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 51%කි.

නිර්දිෂ්ට කෙටිකතාව පිළිබඳ ව අපේක්ෂකයන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නොතිබීමත්, නූතන ගද්‍ය සාහිත්‍යය අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මග පෙන්වීමක් නොලැබීමත් මෙම ප්‍රශ්නයට අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත.

'දියමන්ති මාලය' කෙටිකතාවේ එන ලොයිසල්, පවුල් සංස්ථාවේ සමබරතාව ආරක්ෂා කිරීමේ දී ස්වාමි පුරුෂයකුගේ වගකීම නිසියාකාරයෙන් ඉටු කොට ඇති අයකු වශයෙන් නිරූපණය කිරීමට කතුවරයා සමත් ව ඇති අයුරු සාකච්ඡා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිත පිළිතුර විය. මෙම කරුණු සනාථ කිරීම සඳහා අදාළ කෙටිකතාවෙන් උදාහරණ තුනක්වත් උපුටා දැක්වීම ද අපේක්ෂා කෙරිණි. කෙටිකතාවේ ම දැක්වෙන පාඨ එලෙසින් ම උපුටා දක්වා නැතත් අදාළ අවස්ථාව තම වචනයෙන් උදාහරණ සේ පිළිතුරෙහි යොදා තිබුණේ නම් ඒ සඳහා ලකුණු පිරිනැමීම ද සිදු කෙරිණි. එසේ වුව ද මෙම ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීමේ දී 45%ක් ම ලකුණු ලබා තිබුණේ 06ට අඩුවෙනි.

පිළිතුරු ලිවීම සඳහා ප්‍රශ්නය තෝරා ගැනීම ද 15%ක අඩු ප්‍රතිශතයක් විය. යථෝක්ත කරුණු මගින් අනාවරණය වන්නේ නූතන පරිවර්තන කෙටිකතාවක් වන "දියමන්ති මාලය" ඇසුරෙන් පිළිතුරු ලිවීමට අපේක්ෂකයාට ඇති අපහසුතාව යි. පද්‍ය පන්ති ඇසුරෙන් පිළිතුරු ලිවීමට අපේක්ෂකයා තුළ පවතින රුචිකත්වය නිසා ද මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පැවතීමට හේතු වී ඇති බව පෙනේ.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නූතන පද්‍ය පන්ති පමණක් ම නොව ගද්‍ය සාහිත්‍යය කෘති පිළිබඳව ද ශිෂ්‍යයා තුළ රුචියක් ඇති වන පරිදි පාඩම් සැලසුම් කොට ක්‍රියාත්මක කරන්නේ නම් මෙම තත්ත්වය මග හරවා ගැනීමට හැකි ය. මේ සඳහා භූමිකා රංගනය, නාට්‍යානුසාරී ක්‍රමය, ද්විත්ව සටහන් ජර්නල, චිත්‍ර කතා සැකසීම ආදි ඉගෙනුම් ක්‍රම භාවිත කළ හැකි ය. මෙවැනි ක්‍රම මගින් ප්‍රස්තුත කෙටිකතාවේ එන චරිත, අවස්ථා හා සිද්ධි දෙස රසඥතාවෙන් පිරි මනසින් බැලීමට ශිෂ්‍යයා පෙලඹෙයි. එමගින් ශිෂ්‍යයාගේ විචාරාත්මක දෘෂ්ටිය ද පුළුල් කළ හැකි ය.

07 ප්‍රශ්නය

**7.** පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා 'ජාතික තොටිල්ල' පද්‍ය පන්තියෙන් නිරූපිත අදහස් උපයෝගි කර ගත හැකි ආකාරය, උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය**

නිර්දිෂ්ට පද්‍ය පන්තියෙන් පුද්ගල චරිත සංවර්ධනයට අදාළ ව අදහස් ඉදිරිපත් කර තිබීම අවශ්‍ය ය.

- ⋆ තමන් ලැබූ දිවි පෙවෙතේ....
- ⋆ ඉටු කොට කළ යුතු යුතුකම්....
- ⋆ කරදර දහසක් හමු වී....
- ⋆ කාටත් හිමි පොදු දේ නම්....
- ⋆ මිතුරුකමින් පෙරට එතොත්....
- ⋆ සිනිඳු මොළොක් බව මලෙහී....

උදාහරණ සඳහා ලකුණු 03යි
සමස්ත විස්තරයට ලකුණු 07යි
මුළු ලකුණු 10යි

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




"ජාතික තොටිල්ල" පද්‍ය පන්තිය පාදක කර ගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රමාණය 52%කි. මෙහි සමස්ත පහසුතාව 68%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයෙන් 4%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයෙන් 15%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයෙන් 33%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයෙන් 48%ක් ද
ලබා ගෙන ඇත.

පිළිතුරු සපයා ඇති අපේක්ෂකයන්ගෙන් 19%ක ප්‍රතිශතයක් ලකුණු 0-5 පරාසය තුළ ලකුණු ලබා ගෙන ඇත. 0-2 ප්‍රාන්තරයේ ලකුණු ලබා ගෙන ඇති පිරිස 4%කි. ලකුණු 5ට වැඩියෙන් ලබා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 81%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අපේක්ෂකයන් සපයා ඇති පිළිතුරු යහපත් තත්ත්වයක තිබූ බව යි.




මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 52%ක් වුවත් එහි පහසුතාව 68%ක් වීමෙන් පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන් මධ්‍යස්ථ මට්ටමක ලකුණු ලබා ගෙන ඇති බව යි.

පුද්ගල චරිත සංවර්ධනය සඳහා ජාතික තොටිල්ල පද්‍ය පන්තියෙන් නිරූපිත අදහස් උපයෝගි කරගත හැකි ආකාරය පද්‍ය පන්තියෙන් උපුටා දක්වමින් පිළිතුරු ලිවීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂිත ය. මෙහි දී යථෝක්ත පද්‍ය පන්තියෙන් උදාහරණ පද්‍ය උපුටා දක්වමින් ප්‍රස්තුත තේමාව තහවුරු කිරීම අපේක්ෂකයා කළ යුතු ය. නමුත් අපේක්ෂකයාට ඉහළ ලකුණක් කරා පැමිණීමට අවකාශ නො ලැබී ඇත්තේ ප්‍රස්තුතයට ගැළපෙන පද්‍ය නිවැරදි ව උපුටා දැක්වීමට අපොහොසත් වීම නිසා ය. ඉතා පහසුවෙන් පිළිතුරු ලිවීමට හැකියාව ඇති ප්‍රශ්නයක් වුවත් උචිත නිදසුන් පද්‍ය තෝරා ගැනීමට ඇතැම් අපේක්ෂකයන් අපොහොසත් වීම ද 19%ක පිරිසක් ලකුණු 5ට අඩුවෙන් ලබා ගැනීමට හේතු වී ඇත.

පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නූතන පද්‍ය පන්තිවල අන්තර්ගතය පිළිබඳ විවිධ කෝණවලින් බැලීමට ශිෂ්‍යයා පුහුණු කළ යුතු බව යථෝක්ත කරුණුවලින් තහවුරු වේ. පිළිතුරු සැපයීමේ දී වැදගත් වේ යැයි සැලකෙන පද්‍ය පාඨ මතකයේ තබා ගැනීමට ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

පිළිතුරු සැපයීමේ දී III ප්‍රශ්න පත්‍රය පිළිබඳ ව පොදුවේ බලන කල වැඩි ම පහසුතාව ලබා ගත් ප්‍රශ්න ලෙස පිළිවෙළින් 3, 4, 7 දැක්විය හැකි ය. එවායේ පහසුතාව පිළිවෙළින් 60%, 62%, 68%කි.

1, 6 ප්‍රශ්න පිළිවෙළින් 52% සහ 51% පහසුතා පෙන්නුම් කරන අතර, 2, 5 ප්‍රශ්න 35% සහ 43%ක පහසුතාව පෙන්නුම් කරයි. මේ අනුව අඩු ම පහසුතාවක් දක්වන්නේ 2 ප්‍රශ්නයට යි. එහි පහසුතාව 35%කි. ඒ අනුව III ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 49%කි.

* සිංහල භාෂාව හා සාහිත්‍යය ප්‍රශ්න පත්‍රය දෙස සමස්තයක් වශයෙන් බලන කල්හි ප්‍රශ්න පත්‍ර තුනෙහි සමස්ත පහසුතාව පහත පරිදි වේ.

I ප්‍රශ්න පත්‍රයෙන් සමස්ත පහසුතාව 54%කි.
II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 57%කි.
III ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 49%කි.



# III කොටස

## 3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

## 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද කුමන ප්‍රශ්න අනිවාර්යය ද කොපමණ කාලයක් ලැබේ ද කොපමණ ලකුණු ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය. මේ සඳහා අමතර කියවීම් කාලය ඵලදායි ලෙස භාවිත කළ හැකි ය.

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. තව ද එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයා තිබේ දැයි සුපරීක්ෂාකාරී විය යුතු ය.

* II පත්‍රයේ හා III පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

* අපේක්ෂකයන්ගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නො කළ යුතු ය. අදාළ අවස්ථාවල දී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතු ය.

* පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට, එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුක්ත වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතු ය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි ය.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංශ) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම් දෘශ්‍යාධාරක භාවිත කරමින් හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ පරිශීලනය කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රගුණ කළ යුතු ය.

★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව 10 ශ්‍රේණියේ පෙළපොතෙහි අදාළ පාඩම් දෙක ආශ්‍රිත අභ්‍යාසවල යොදවමින් 10, 11 ශ්‍රේණි දෙකේ දී ම ක්‍රියාකාරකම්වල නිරත කළ යුතු ය.

★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතු ය.

★ රචනා ලිවීමේ දී ව්‍යූහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර, අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ ව 10 වන ශ්‍රේණියේ දී ම මග පෙන්වීම කළ යුතු ය.

★ ප්‍රායෝගික ලේඛන ලිවීමේ දී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතියේ වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය.

★ සාහිත්‍ය පෙළපොතෙහි ඇතුළත් පාඩම් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විට ම සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවිධානය කරගත යුතු ය.

★ ව්‍යාකරණ ඉගැන්වීමේ දී, කවිය, ගීතය හා ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කරගත යුතු ය.

★ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් යෝග්‍ය ඉගැන්වීම් ක්‍රම මගින් එහි භාවිත හැකියාව ඉහළ නැංවීමට පියවර ගත යුතු ය.

★ සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහු අර්ථ පද ඇතුළු වාක්කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිතර යෙදීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.

★ අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදි ව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතු ය.

★ බාහිර පොත් පත් කියවීමට පෙළඹෙන පරිදි විෂය සමගාමී කටයුතු සංවිධානය කළ යුතු ය.

★ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයෙහි යෙදවීමට ද උනන්දු විය යුතු ය.

★ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

★ අත් පත්‍රිකා, රාජකාරි ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අත්දැකීම් සිසුනට ලබාදීමට ක්‍රියා කළ යුතු ය.

★ වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න නො වූ සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

★ සංවේදීභාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍යයෙන් සිදු වනුයේ අපමණ මෙහෙයකි. එවැනි පුද්ගලයන් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරු භවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.